# මැතිවරණ කොමිෂන් සභාව

# 2022 අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන කාර්ය සාධන වාර්තාව

**2022 අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන කාර්ය සාධන වාර්තාව**

**සම්පාදනය, පරිගණක පිටු සැකසුම හා සැලසුම**

**නීති විමර්ශන හා සැලසුම් අංශය**

**ප්‍රකාශය**

**මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය.**

**මුද්‍රණය**

**රජයේ මුද්‍රණාලය**

# පටුන

## I කොටස


පෙරවදන ....................................................................................................vii

1. මැතිවරණ දෙපාර්තමේන්තුව....................................................................................1
2. මැතිවරණ කොමිෂන් සභාව......................................................................................1
3. මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථ හා බලතල .........................................................2
4. මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම .........................................................................4
5. මැතිවරණ කොමිෂන් සභාවේ මෙහෙවර ......................................................................4
6. මැතිවරණ කොමිෂන් සභාවේ අගයන් ........................................................................4
7. මැතිවරණ කොමිෂන් සභාවේ අවධාරිත ක්ෂේත්‍ර ..............................................................5
8. මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථ.......................................................................5
9. මැතිවරණ කොමිෂන් සභාවේ උපායමර්ග......................................................................6
10. 1931 සිට 2021 දක්වා මැතිවරණ කොමිෂන් සභාව ක්‍රියාත්මක කරනු ලබන අණ පනත්......7
11. මැතිවරණ කොමිෂන් සභාවේ පරිපාලන සංයුතිය ..........................................................9
12. මැතිවරණ කොමිෂන් සභාවේ එක් එක් ශාඛා හා ඒවායේ කාර්යභාර්ය...............................10

    I. කොමිෂන් සභා ලේකම් කාර්යාලය ..........................................................................10

    II. ජාතික මැතිවරණ ශාඛාව......................................................................................10

        II.I. තොරතුරු තාක්ෂණ අංශය...............................................................................10

    III. පළාත් පාලන ඡන්ද විමසීම් ශාඛාව.......................................................................11

    IV. පාලන ශාඛාව ...................................................................................................11

        IV.I. ආයතන අංශය ..........................................................................................12

        IV.II. ප්‍රවාහන අංශය ..........................................................................................12

        IV.III. ප්‍රසම්පාදන අංශය.......................................................................................12

    V. ගිණුම් ශාඛාව.....................................................................................................12

    VI. නිතී, විමර්ශන හා පර්යේෂණ හා සැලසුම් ශාඛාව .......................................................13

        VI. I. මාධ්‍ය අංශය..............................................................................................13

    VII. අභ්‍යන්තර විගණන ශාඛාව....................................................................................13

    VIII. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල...................................................................................14

13. මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය ...........................................................15

II කොටස


1. උපාය මාර්ග සැලැස්ම (2022-2025) සකස් කිරීම........................................19
2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම........................................19
3. මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම් ........................................19
4. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමට පත්කොට ඇති කමිටුව වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා........................................20
5. මැතිවරණ නීති සංශෝධනයට පත් කරන ලද පාර්ලිමේන්තු තේරීම්කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද යෝජනා........................................21
6. ඡන්ද හිමියන් ලියාපදිංචිය........................................25
7. 2019 හා 2020 මැතිවරණ කොට්ඨාස සහ පරිපාලන දිස්ත්‍රික්කය අනුව ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව........................................30
8. ඡන්දහිමි නාමලේඛනයේ තොරතුරු පරිගණක/ ජංගම දුරකථන මගින් ලබා ගැනීමේ වැඩසටහන ........................................31
9. ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචියට සහාය වීම සඳහා දුරකථන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම........................................32
10. ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට පුරවැසියන් දැනුම්වත් කිරීමේ කෙටි පණිවුඩයක් යැවීම. ........................................32
11. ඡන්ද හිමි නාමලේඛන උපුටන නිකුත් කිරීම. ........................................33
12. වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන්ට කඩිනමින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට කරන ලද 2021 අංක 22 දරන (සංශෝධිත) පනත සම්මත කිරීම ........................................33
13. දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම ........................................33
14. පළාත් සභා ඡන්ද විමසීම........................................35
15. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ........................................35
16. නීති කටයුතු ........................................36
17. ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් ඇති වගකීම.............37
18. මූල්‍ය පාලනය ........................................39
19. විගණන තොරතුරු ........................................40
20. මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය........................................40
21. විදේශ පුහුණු වැඩසටහන්........................................42
22. විදේශ නිල චාරිකා ........................................42
23. දේශපාලන පක්ෂ ලේකම්වරු සමඟ පවත්වන ලද සාකච්ඡා........................................42
24. දිස්ත්‍රික් ලේකම්වරු/ දිසාපතිවරු සමඟ පවත්වන ලද සාකච්ඡා........................................43
25. මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සමඟ පවත්වන ලද සාකච්ඡා ........................................43
26. දකුණු ආසියානු මැතිවරණ කළමනාකරණ ආයතන බලධාරීන්ගේ සංසදය (FEMBoSA) 2021 සමුළුව........................................44
27. මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු ........................................45

28. මාධ්‍යවේදීන් සඳහා පවත්වන ලද පුහුණු වැඩමුළුව ............................................................46
29. ගොඩනැගිලි ඉදිකිරීම් හා නවීකරණ කටයුතු .......................................................................47
30. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අදාළ කටයුතු ................48
31. දැනුම් කළමණාකරණ ඒකකය හා කෞතුකාගාරය ..............................................................48
32. කතිරයේ බලය පුවත් සඟරාව ..............................................................................................49
33. මැතිවරණ වාර්තා ................................................................................................................49
34. තොරතුරු තාක්ෂණ භාවිත කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහය ..................................................50
35. සමාප්තිය ..............................................................................................................................51

# පෙරවදන

පාලන බලයට සහභාගී වීමේ ජනතා අයිතිය පූර්ණව සාක්ෂාත් කරනු පිණිස ජනතා පරමාධිපත්‍ය සුරක්ෂා වන පරිදි නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව සුවිශාල කාර්ය භාරයකට මුලපුරා ඇති පසුබිමක් මධ්‍යයේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 2022 වර්ෂයේ අයවැය කාරක සභා අවස්ථා විවාදය සඳහා ඉදිරිපත් කරනු ලබන 2021 වර්ෂයේ මැතිවරණ කොමිෂන් සභාව ඉටු කරන ලද කාර්යයන් හි ප්‍රගතිය පිළිබඳව මෙම කාර්ය සාධන වාර්තාවෙන් පිළිබිඹු කෙරේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කොට තිබෙන පරිදි මැතිවරණ, ඡන්ද විමසීම් හා ජනමත විචාරණ පවත්නා නීතිරීති අනුව නිදහස් හා සාධාරණව පැවැත්වීමටත්, වාර්ෂික ඡන්දහිමි නාමලේඛන පිළියෙල කිරීම හා ප්‍රතිශෝධන ක්‍රියාවලිය සිදු කිරීමත් මැතිවරණ කොමිෂන් සභාවේ බලතල හා කාර්ය භාරයට අයත් වුවද කොමිෂන් සභාවේ කාර්ය කර්තව්‍යයන් එම කටයුතුවලට පමණක් සීමා නොවන බව ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ව ඇති අතර ඡන්ද විමසීම් නිදහස් හා සාධාරණ ලෙස පැවැත්වීම සඳහා සුවිශාල බලතල මැතිවරණ කොමිෂන් සභාවට හිමි ව තිබේ. මෙම අණපනත් හා නීතිරීති සියල්ල රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම වෙනුවෙන් ක්‍රියාවට නැංවීම මැතිවණ කොමිෂන් සභාවේ වගකීමක් ලෙස සලකනු ලබන අතර ඒ සඳහා මෙම වසර තුළ දී උපරිම වශයෙන් ක්‍රියාත්මක වීමට හා දායකත්වය ලබා දීමට කොමිෂන් සභාවට හැකි වීම පිළිබඳව සතුටින් සිහිපත් කරමි.

රට තුළ අනපේක්ෂිතව ව්‍යාප්ත වූ කොවිඩ් - 19 වෛරසය පාලනය පිණිස සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපැදීම තදින් ක්‍රියාත්මක වූ කාල වකවානුවක මෙම වසරේ අපේක්ෂිත ඉලක්ක සියල්ල සපුරා ගැනීම බාධාවක් ව පැවැතුණු බව නොරහසකි. එය රටේ සමස්ත සමාජ/ ආර්ථික ක්‍රියාවලියට බලපෑම් කළ සිදුවීමක් වුව ද මැතිවරණ කොමිෂන් සභාව විසින් පැවැති මෙම බාධක ඔස්සේ 2020/ 2021 වාර්ෂික ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලියේ කාර්යයන් සාර්ථකව සිදුකිරීම, ඉදිරි ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා වන නෛතික ක්‍රියාවන් හි අත්‍යවශ්‍යයන් ම සිදු කළ යුතු නීති සංශෝධන සම්මත කර ගැනීම උදෙසා අවශ්‍ය ක්‍රියාමාර්ගවලට අවතීර්ණ වීම, දීර්ඝ කලක් මුළුල්ලේ යෞවන යෞවනියන් හා පාර්ශ්වකාර කණ්ඩායම් ඉල්ලීම් කළ වයස අටළොස් විය සම්පූර්ණ වූ විගස ඡන්දහිමි නාමලේඛනයේ නම ලියාපදිංචි කර ගැනීමට අදාළ සංශෝධන පනත සම්මත කර ගැනීම, තාක්ෂණය මහජන යහපත සඳහා යොදා ගනිමින් ඡන්දහිමි නාමලේඛනයේ නම ලියාපදිංචි කර ගැනීම හා එහි උපුටන ලබාගැනීම සඳහා සරල හා පහසු ක්‍රමවේද හඳුන්වා දීම, කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය හා භෞතික සම්පත් වැඩි දියුණු කිරීම ආදී කටයුතුවලින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට හැකි වූ බව නොපැකිලිව සඳහන් කරනු කැමැත්තෙමි.

මැතිවරණ කොමසාරිස් ජනරාල් හා ලේකම් ප්‍රමුඛ මැතිවරණ කොමිෂන් සභාවේ සියලුම නිලධාරීන් හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල සියලුම නිලධාරීන් රට තුළ පැවැති අයහපත් වාතාවරණය ඔස්සේ වුව ද, කොමිෂන් සභාවේ දැක්ම/ මෙහෙවර සාක්ෂාත් කරගනු වස් තමන් වෙත පැවරුණු කාර්යයන් හා නිලධාරීන් විසින් නිර්මාණය කොට ක්‍රියාත්මක කළ කාර්යයන් සම්බන්ධයෙන් කරනු ලැබූ අපරිමිත කැප

කිරීම තුළින් මෙම ඉහළ ප්‍රගතිය අත්පත් කර ගැනීමට හැකි වූ බව ඔවුනට කරන ගෞරවයක් වශයෙන් සඳහන් කරන අතර ඒ පිළිබඳව එම සියලුම නිලධාරීන් වෙත කෘතඥතාව පිරිනමමි. එමෙන්ම මෙම සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයින් දැක් වූ සාමූහික ප්‍රයත්නය සහ මෙහෙවර ඉතා ඉහළින් අගය කරමි. එසේම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී/ දිසාපතිවරු ප්‍රමුඛ කොමිෂන් සභාවේ කටයුතු සඳහා සම්බන්ධ වන රාජ්‍ය නිලධාරීන්, දේශපාලන පක්ෂ හා නිරීක්ෂණ සංවිධාන නියෝජිතයන් ලබාදුන් සහය ද ඇගැයීමට ලක්විය යුතු ය. තව ද, ඉතා කෙටි කාලයක් තුළ දී මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි මෙම වාර්තාව පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සංඛ්‍යා සහ ඡායාරූප ලබා දුන් සියලුම අංශ ප්‍රධානීන්, ප්‍රකාශනය සම්පාදනය කළ නීති විමර්ශන හා සැලසුම් අංශයේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට සහ භාෂා පරිවර්තන කටයුතු සිදු කළ කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක නිලධාරීන් වෙත ද කෘතඥතාව පිරිනමනු කැමැත්තෙමි.

**නීතිඥ නිමල් පුංචිහේවා**
**සභාපති**
**මැතිවරණ කොමිෂන් සභාව**

## 01. මැතිවරණ දෙපාර්තමේන්තුව

දිවයිනේ පාලන කටයුතුවල දී දේශීය ජනතාවට සහභාගීවීමේ වැඩි අවස්ථා සැලසිය යුතු යැයි 20 වන සියවසේ මුල් භාගයේ පැන නැගුණු ප්‍රබල උද්ඝෝෂණවලට ප්‍රතිචාරයක් වශයෙන් බ්‍රිතාන්‍ය කිරීටය විසින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා 1944 වසරේ දී සෝල්බරි කොමිසම පත් කරන ලදී. සෝල්බරි කොමිසම විසින් ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමත් පාර්ලිමේන්තු ඡන්ද විමසීම් පැවැත්වීමත් සඳහා වූ නීති සම්පාදනය කරන ලද අතර 1946 සැප්තැම්බර් 26 දින පාර්ලිමේන්තු ඡන්ද විමසීම් රාජ ආඥාව පනවන ලදී. පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම පැවැත්වීම සඳහා 1946 දී පළාත් පාලන ආඥා පනත ඉදිරිපත් කරන ලදී. 1946 සිට 1955 දක්වා වූ කාල වකවානුවේ දී ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමත් පාර්ලිමේන්තු ඡන්ද විමසීම් පැවැත්වීමත් සඳහා එක් කොමසාරිස්වරයෙකු යටතේ පාර්ලිමේන්තු මැතිවරණ දෙපාර්තමේන්තුවත් පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා තවත් කොමසාරිස්වරයෙකු යටතේ පළාත් පාලන මැතිවරණ දෙපාර්තමේන්තුවත් ක්‍රියාත්මක විය. එලෙස වෙන් වෙන්ව පැවති පාර්ලිමේන්තු මැතිවරණ දෙපාර්තමේන්තුව හා පළාත් පාලන මැතිවරණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කොට 1955 ඔක්තෝබර් 1 වැනි දින මැතිවරණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.

## 02. මැතිවරණ කොමිෂන් සභාව

2015 වර්ෂයේ දී දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ස්වාධීන කොමිෂන් සභා ස්ථාපනය කිරීමට රජය විසින් පියවර ගත් අතර ඒ අනුව එතෙක් පැවති මැතිවරණ දෙපාර්තමේන්තුව අහෝසි වී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත අතිගරු ජනාධිපතිතුමා විසින් සභාපතිවරයකු ඇතුළු සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත මැතිවරණ කොමිෂන් සභාව 2015.11.13 දින සංස්ථාපනය කරනු ලැබීය. එම කොමිෂන් සභාවේ සණ පූරණය ද සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය. පුරා වසර 05ක් තිස්සේ එම පළමු කොමිෂන් සභාව ක්‍රියාත්මක වූ අතර 2018.02.10 දින පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක් ද (එක් සභාවක් හැර) 2019.10.11 දින ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ ඡන්ද විමසීමක් ද 2019.11.18 දින ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීමක් හා 2020.08.05 දින පාර්ලිමේන්තු මැතිවරණයක් එම කොමිෂන් සභාවේ සෘජු අධීක්ෂණය යටතේ පවත්වන ලදී.

2020 ඔක්තෝම්බර් 29 දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද විසිවන සංශෝධනය මගින් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව පහක් දක්වා වැඩි කරන ලදී. ඒ අනුව 2020.12.10 දින පාර්ලිමේන්තු සභාවේ නිර්දේශ මත දෙවන මැතිවරණ කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද අතර එය සභාපති ඇතුළු සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය. එම කොමිෂන් සභාවේ සණ පූරණය සාමාජිකයන් තිදෙනෙකි.

නීතීඥ නිමල් ජී. පුංචිහේවා මහතා සභාපතිවරයා ලෙස ද මහ භාණ්ඩාගාරයේ හිටපු නියෝජ්‍ය ලේකම්වරයෙකු වූ එස්.බී. දිවාරත්න මහතා, හිටපු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙකු වූ එම්.එම්. මොහමඩ් මහතා, හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වූ කේ.පී.පී. පතිරණ මහතා, මානව හිමිකම් ක්‍රියාකාරියෙකු වූ ජීවන් ත්‍යාගරාජා යන මහත්වරු කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයන් ලෙස ද

පත් කරන ලදී. ජීවන් ත්‍යාගරාජා මහතා උතුරු පළාත් ආණ්ඩුකාරවර ලෙස 2021.10.10 දින පත්ව ගිය අතර ඒ මහතා වෙනුවට ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරිනියක වූ හිටපු උතුරු පළාත් ආණ්ඩුකාරවර පී.එස්.එම්. චාල්ස් මහත්මිය 2021.10.28 දින පත් කරන ලදි.

## 03. මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථ හා බලතල

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (2) ව්‍යවස්ථාවෙහි සඳහන් පරිදි නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුතු ය. එමෙන්ම පවත්නා මැතිවරණ නීති අනුව මැතිවරණ පැවැත්වීමටත්, වාර්ෂික ඡන්දහිමි නාමලේඛන පිළියෙල කිරීම හා ප්‍රතිශෝධනය කිරීමටද කොමිෂන් සභාවට බලය ඇති අතර, කොමිෂන් සභාවේ කටයුතු එම බලතලවලට සහ කාර්ය කර්තව්‍යවල ට සීමා නොවන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (1) ව්‍යවස්ථාවෙහි දක්වා ඇත. මේ අනුව අදාළ අණ පනත් අනුව මැතිවරණ පැවැත්වීමේ වගකීම පැවැරුණු මැතිවරණ දෙපාර්තමේන්තුවට වඩා විශේෂිත වගකීමක් මැතිවරණ කොමිෂන් සභාවට පැවරී ඇත. ඊට අදාළව දහනව වන ව්‍යවස්ථා සංශෝධනය මගින් මූලික නීතියට විශේෂ විධිවිධාන ඇතුළත් කර ඇති බැවින් මැතිවරණ කොමිෂන් සභාවේ බලය හා ශක්තිමත් බව ඉහළ නංවා ඇත.

මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවීමේ දී කොමිෂන් සභාවට විශේෂ බලතල ලබා දී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 අ ව්‍යවස්ථාව යටතේ අධිකරණ බලයට යටත්ව,

I. කොමිෂන් සභාවේ තීරණ, විධිවිධාන හෝ ක්‍රියා අවසානාත්මක හා තීරණාත්මක වීම හා
II. මැතිවරණ කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකු හෝ නිලධරයකුට මැතිවරණයක් පැවැත්වීම හා සම්බන්ධ යම් නීතියක් යටතේ සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් පැවරිය නොහැකි වීම.

යන විශේෂ මුක්තීන් ලබා දී ඇත. මෙම මුක්තීන් ලබා දී ඇත්තේ 126 වන ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ අභියාචනා අධිකරණ බලය, 130 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරණය, මැතිවරණ පෙත්සම් ආදිය සම්බන්ධයෙන් ඇති අභියාචනා අධිකරණ බලය, 144 වන ව්‍යවස්ථාව යටතේ මන්ත්‍රී ධුරයකට තෝරා ගැනීමට අදාළ පෙත්සම් විභාගයට ඇති අභියාචනා අධිකරණ බලයට යටත්ව ය. තවද, මැතිවරණ ක්‍රියාවලිය මෙහෙයවීමේ දී නීති බලාත්මක කිරීම හා සුරක්ෂිත කිරීම ද ස්වකීය කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ද හැර වෙනත් වගකීමට මැතිවරණ කොමිෂන් සභාව බැඳී නැති බව විශේෂිත කාරණයකි. මේ හැර රාජ්‍ය දේපල අවභාවිතාව වැලැක්වීම සම්බන්ධයෙන් විශේෂිත බලයක් 104 ආ (4) (අ) ව්‍යවස්ථාව යටතේ ලබා දී ඇති අතර, 104 (5) (අ) ව්‍යවස්ථාව අනුව ඡන්ද විමසීම් සීමාවේ දී නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කිරීම සඳහා මාධ්‍ය ආයතන වෙත මාධ්‍ය උපමාන නියම කිරීමට හා ඊට අදාළව විධිවිධාන පැනවීමට ඉඩ සලසා ඇත. 104 ඇ ව්‍යවස්ථාව යටතේ පොලිසිය යොදවා ගැනීමට ද, 104 ඈ ව්‍යවස්ථාව යටතේ සන්නද්ධ හමුදා යෙදවීමට ද, කොමිෂන් සභාව වෙත විශේෂ බලතල ලබා දී තිබේ.

මේ අනුව බලන විට මැතිවරණ කොමිෂන් සභාවෙහි බලතල ඉහළ දැමීමට ගෙන ඇති පියවර රාශියකි. එනම්,

I. කොමිෂන් සභාව පත් කිරීමට අදාළ විශේෂ විධිවිධාන;
II. මැතිවරණ කටයුතු පැවරෙන නිලධාරීන්ට වෙනත් රජයේ භෞතික හා මානව සම්පත් ලබා ගැනීමට හැකි ආකාරයේ ප්‍රතිපාදන;
III. කොමිෂන් සභාවේ තීරණයන්හි ඇති අවසානාත්මකභාවය හා නඩු කටයුතුවල දී ලැබෙන විශේෂ මුක්තිය;
IV. රාජ්‍ය දේපල පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීම තහනම් කිරීමට ඇති බලය;
V. මැතිවරණ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සඳහා මාධ්‍ය උපමාන, මාර්ගෝපදේශ පැනවීමේ බලතල;
VI. පාර්ලිමේන්තුව විසුරුවා ඇති විටෙක මැතිවරණවලට අයුතු බලපෑම් වළකාලීමට ඇති නීති;
VII. සාධාරණ ඡන්ද විමසීමකට උචිත වාතාවරණය නිර්මාණය කිරීම ජනාධිපතිවරයාගේ වගකීමක් සේ සැලකීම.

ඉහත කරුණු අනුව එම විශේෂ බලතල හා නීතිමය ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින්ම සලසා තිබීම තුළින් මැතිවරණ කොමිෂන් සභාවට සිය කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමට හා මැතිවරණ ක්‍රියාවලිය මෙහෙයවීමට හා කළමනාකරණයට අවශ්‍ය ශක්තිය හා බලය ලබා දී ඇති බව තහවුරු වේ.

## 04. මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම

"සර්වජන ඡන්ද බලය සුරකින දේශයක්"

## 05. මැතිවරණ කොමිෂන් සභාවේ මෙහෙවර

"ජනතා පරමාධිපත්‍යය, සර්වජන ඡන්ද බලය හා සබැඳි ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ආරක්ෂා කරමින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිදි අදාළ සියළු පාර්ශ්ව දැනුවත් කෙරෙන නිදහස්, සාධාරණ හා විශ්වසනීය මැතිවරණ ක්‍රියාවලියක් කාර්යක්ෂමව හා සඵලතාවයෙන් යුතුව මෙහෙයවීම."

## 06. අගයන්

- **අවංක බව (ඍජු බව)**

  මැතිවරණ කොමිෂන් සභාවේ හා එහි නිලධාරීන්ගේ අවංකභාවය, උසස් චරිතවත්භාවය හා ඍජු ප්‍රතිපත්ති පවත්වාගෙන යාම.

- **විනිවිදභාවය**

  සියලූම කටයුතුවල දී මැතිවරණ කොමිෂන් සභාව හා එහි නිලධාරීන් සත්‍යවාදී ලෙස, සාධාරණ ලෙස හා විවෘත ලෙස ක්‍රියාකරන බව.

- **විවෘතභාවය**

  මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් කිසිවක් නොසඟවා කථාකරන බව හා ක්‍රියාකරන බව.

- **කැපවීම**

  මැතිවරණ කොමිෂන් සභාවේ කටයුතුවල දී එහි දැක්මට, මෙහෙවර ප්‍රකාශයට, අපේක්ෂා හා අරමුණුවලට මුළුහදින්ම එකඟව ක්‍රියාකිරීම හා ඉදිරිපත්වන ගැටලු හා අභියෝගවලට නොපසුබටව මුහුණදීම.

- **වගකීමට ඇති බැඳීම**

  රාජකාරී කටයුතුවල දී මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් සදාචාරාත්මකව වගකීමට බැඳී සිටීම.

- **වගවීම**

  මැතිවරණ කොමිෂන් සභාව හා එහි නිලධාරීන් තමන්ගේ සියලු කටයුතු පිළිබඳ වගවීම, ඒ කටයුතුවල වගකීම්වලට බැඳීම, තමන් කරන කටයුතුවල ප්‍රතිඵල විනිවිද පෙනෙන ලෙස ප්‍රකාශයට පත්කිරීම.

- **අපක්ෂපාතීභාවය**

  මැතිවරණ කොමිෂන් සභාව හා එහි නිලධාරීන් එක් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් හා බැඳී නොසිටීම හා එවැනි බලපෑම්වලට ගොදුරු නොවීම, පාර්ශවයන් නොගැනීම.

- **කණ්ඩායම් හැඟීම හා එක් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම**

  මැතිවරණ කොමිෂන් සභාවේ ඉහළම නිලධාරියා ඇතුළු සෑම නිලධාරියෙකු තුළම නිවැරදි ආකල්ප සහිතව එක්ව කටයුතු කිරීම පිළිබඳ හැඟීමක් තිබීම.

## 07. අවධාරිත ක්ෂේත්‍ර

- **අවබෝධය ඉහළ නැංවීම හා සවිඥනකභාවය ඇති කිරීම**

  මෙහි මූලික අරමුණ වනුයේ ජනතා පරමාධිපත්‍යය හා සර්වජන ඡන්ද බලය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අවදිමත්භාවය හා සවිඥානිකභාවය ඉහළ නැංවීමය. සවිඥානිකභාවය යනු යමක් පවතින්නේ කුමක් සඳහා ද යන්න පිළිබඳව පැනනගින ප්‍රශ්න, මානුෂික අභිමානය පිළිබඳ ගැටලු, නිදහස, අධිකාරය, බුද්ධිමත්භාවය හා සමාජමය වගකීම යන කාරණා පිළිබඳව පවත්නා අවබෝධයයි.

- **නීතිමය හා නීති උපදේශනාත්මක කටයුතු**

  ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා වන බව තහවුරු කිරීම හා නිදහස් සාධාරණ හා විශ්වසනීය ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා නීති උපදේශනය අවශ්‍ය වේ. කිසියම් ගැටලුවක් සම්බන්ධයෙන් අවබෝධය ඇති කරලීම, ප්‍රතිපත්ති සම්පාදකයන් කෙරෙහි බලපෑම් ඇති කිරීම හා පුරවැසියන් කෙරෙහි බලපාන කාරණාවන්හි වෙනස්කම් ඇති කිරීම හා ඒවා වැඩිදියුණු කිරීමත් මතභේද ඇති වූ විට ඒවා නිරාකරණය කිරීම, ඒවාට මැදිහත්වීම, උපදෙස් දී ම, එම මතභේද නිරාකරණය කිරීමට උපකාරී වන තොරතුරු ලබාදීම හා විශේෂයෙන් මෙම කාරණයෙහිලා අධිකාරය දරණ කෙනෙකු දෙන ආකාරයේ උපදෙස් දීම මීට ඇතුළත් වේ.

- **ආයතනික සංවර්ධනය**

  ආයතනයේ අපේක්ෂා හා එහි දැක්ම තිරසාර ලෙස ඉටුවීම සඳහා මානව, භෞතික හා මූල්‍ය සම්පත් උපයාගැනීමට සමත් ආයතනයක් වශයෙන් තම ආයතනය කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස සංවිධානය කිරීම හා සවිමත් කිරීම; ඡන්ද විමසීම් කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස පැවැත්වීම සඳහා වැඩිදියුණු කරන ලද තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතය බහුල වශයෙන් ප්‍රයෝජනයට ගැනීම හා සම්පත් කළමනාකරණය.

- **පර්යේෂණ හා තොරතුරු බෙදා ගැනීම**

  ප්‍රමුඛ වශයෙන් ඡන්ද විමසීම් ක්‍රියාවලියට අදාළ හා මැතිවරණ කළමනාකරණ ආයතනයට අදාළ ප්‍රතිපත්ති පිළිබඳ පර්යේෂණ කිරීම, එම පර්යේෂණ ප්‍රතිඵල හා ඒවායින් උගත් පාඩම් සෙසු පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීම සඳහා බෙදා හදා ගැනීම, ඡන්දය පාවිච්චි කිරීම හා ජනතාවගේ පරමාධිපත්‍යයට අදාළ කාරණා සම්බන්ධයෙන් අවස්ථාවක් ලබාදීම සඳහා භාවිතයට ගැනීම.

## 08. පරමාර්ථ

- සුදුසුකම් ඇති සියලුම පුරවැසියෝ නිදහස් හා සාධාරණ ලෙස පවත්නා ඡන්ද විමසීම්වල දී නොබියව, නිදහසේ, විශ්වාසයක් ඇතිව ඡන්දය පාවිච්චි කරති.
- සියලුම පුරවැසියන් ඡන්දය පාවිච්චි කිරීම තමන් වෙත ඇති අන්සතු කළ නොහැකි අයිතියක් බවත් තමන් මැතිවරණ ක්‍රියාවලිය තුළ ක්‍රියාකාරී ලෙස සහභාගී වන බවත් අවබෝධ කර ගනිති.
- ඡන්ද විමසීම් කාලසීමාව තුළ දී සියලු ඡන්ද අපේක්ෂකයන්ට සම හා සාධාරණ අවස්ථා ලැබී තිබේ.

- සෑම ඡන්ද විමසමකට පෙර පූර්වයෙහි සුදුසුකම් ලත් සියලු පුරවැසියන් ඇතුළත් වූ යථාවත් කරන ලද ඡන්ද හිමි නාමලේඛනයක් සකස් කර තිබේ.
- සාමාජික වශයෙන් ආන්තික ලෙස ජීවත් වන සියලු පුරවැසියෝ විශ්වාසවන්ත ලෙස හා ප්‍රමාණවත් ලෙස ඡන්ද විමසීම් ක්‍රියාවලියට සහභාගී වෙති.
- මැතිවරණ ක්‍රියාවලිය දක්ෂ ලෙස හා පාරදෘෂ්‍ය ලෙස පරිපාලනය වේ.
- ඡන්ද විමසීම් ක්‍රියාවලියට හා මැතිවරණ කොමිෂන් සභාවට අදාළ දත්ත හා තොරතුරු පාර්ශ්වකරුවන්ට ලබාගැනීමේ පහසුකම කාලානුකූලව හා ප්‍රමාණවත් ලෙස සලසා තිබේ.

## 09. උපාය මාර්ග

- ආයතනික සංවර්ධනය.
- කාර්ය මණ්ඩලයේ හැකියාවන් දියුණු කිරීම.
- භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් අරමුදල් ලබාගැනීම.
- ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය සඳහා උනන්දුවක් දක්වන දේශීය හා ජාත්‍යන්තර සිවිල් සමාජ සංවිධාන සමග එක්ව කටයුතු කිරීම.
- සර්වජන ඡන්ද බලය සුරක්ෂිත කිරීමෙහිලා පුරවැසියා උනන්දු කිරීම.


## 10. මැතිවරණ කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන අණ පනත්

- **ජනධිපතිවරණය**
  - 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනත
  - 1988 අංක 16 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ (සංශෝධන) පනත -
  - 1988 මැයි මස 24
  - 1988 අංක 35 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ (සංශෝධන) පනත -
  - 1988 ඔක්තෝබර් මස 21
  - 2004 අංක 14 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ (සංශෝධන) පනත -
  - 2004 නොවැම්බර් මස 18
  - 2011 අංක 28 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ (සංශෝධන) පනත -
  - 2011 මැයි මස 25
- **පාර්ලිමේන්තු මැතිවරණ**
  - 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත - 1981 ජනවාරි මස 22
  - 1988 අංක 15 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 1988 මැයි මස 24
  - 1988 අංක 29 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 1988 අගෝස්තු මස 16
  - 1988 අංක 35 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 1988 ඔක්තෝම්බර් මස 21
  - 1988 අංක 54 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 1988 දෙසැම්බර් මස 17
  - 2004 අංක 14 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 2004 නොවැම්බර් මස 18
  - 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 2009 ඔක්තෝම්බර් මස 16
  - 2011 අංක 28 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත - 2011 මැයි මස 25
- **පළාත් සභා ඡන්ද විමසීම**
  - 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත - 1988 ජනවාරි මස 27
  - 1988 අංක 35 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 1988 ඔක්තෝම්බර් මස 21
  - 1988 අංක 55 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 1988 දෙසැම්බර් මස 17
  - 1990 අංක 29 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 1990 ජුලි මස 06
  - 1993 අංක 7 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 1993 පෙබරවාරි මස 18
  - 2004 අංක 5 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 2004 පෙබරවාරි මස 03
  - 2004 අංක 14 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 2004 නොවැම්බර් මස 18
  - 2011 අංක 28 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 2011 මැයි මස 25
  - 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත - 2017 සැප්තැම්බර් මස 22
- **පළාත් පාලන ආයතන ඡන්ද විමසීම**
  - පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 වන අධිකාරය)
  - 1990 අංක 24 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත
  - 1990 අංක 25 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත
  - 2002 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත
  - 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත -
  - 2017 අගෝස්තු මස 31

- **ජනමතවිචාරණය**
    - 1981 අංක 7 දරන ජනමතවිචාරණ පනත - 1981 පෙබරවාරි මස 27
    - 1988 අංක 17 දරන ජනමතවිචාරණ (සංශෝධන) පනත - 1988 මැයි මස 24
- **ඡන්දහිමියන් ලියාපදිංචි කිරිම**
    - 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත - 1980 ඔක්තොම්බර් මස 24
    - 2017 අංක 10 දරණ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත - 2017 ජුලි මස 21
    - 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත - 2021 ඔක්තෝම්බර් මස 13

## 11. මැතිවරණ කොමිෂන් සභාවේ පරිපාලන සංයුතිය

මැතිවරණ කොමිෂන් සභාව ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල 26 කින් සමන්විත වේ. ඒ අනුව ස්වකීය ව්‍යවස්ථාපිත, පරිපාලන හා සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන විෂයන් ආවරණය වන පරිදි ශාඛා/ අංශ ස්ථාපිත කොට ඇති අතර එක් එක් ශාඛා/ අංශ විසින් ඉටුකළ යුතු කාර්යයන් නිශ්චිතව මෙම පරිපාලන සංයුතියට ඇතුළත්ව තිබේ.



## 12. මැතිවරණ කොමිෂන් සභාවේ එක් එක් ශාඛා හා ඒවායේ කාර්යභාරය

### I. කොමිෂන් සභා ලේකම් කාර්යාලය

- මැතිවරණ කොමිෂන් සභා රැස්වීම් පැවැත්වීමට අදාළ කාර්යයන්
- කොමිෂන් සභා වාර්තා හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වාර්තා සකස් කිරීම.
- මැතිවරණ කොමිෂන් සභාවේ සමාන්‍ය පරිපාලන කටයුතු
- මාණ්ඩලික නිලධාරින්ගේ ලිපි ගොනු නඩත්තු කිරීම.

### II. ජාතික මැතිවරණ ශාඛාව

- ජනාධිපතිවරණ, පාර්ලිමේන්තු මැතිවරණ සහ ජනමතවිචාරණ පැවැත්වීම සඳහා වූ කාර්යයන් මෙහෙයවීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙත හා මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත සහාය වීම.
- 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත අනුව වාර්ෂික ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ සියලු කටයුතු මෙහෙයවීම සහ ඡන්දහිමි නාමලේඛන ආශ්‍රිත වෙනත් කාර්යයන්.
- 2017 අංක 17 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතට අදාළ පරිපූරක ඡන්ද හිමි නාමලේඛන සකස් කිරීම, ඊට අදාල කාර්යයන් සංවිධානය කිරීම හා 2021 අංක 22 දරණ ඡන්ද හිමියන් ලියාපදිංචියට අදාළ (සංශෝධන) පනතට අදාළ කාර්යයන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- පාර්ලිමේන්තු මන්ත්‍රී ධූර පුරප්පාඩු පිරවීමට අදාළ මුලික කටයුතු.
- ඡන්දහිමි නාමලේඛනය හා ඡන්ද විමසීම් ක්‍රියාවලිය පිළිබඳව පුරවැසියන් දැනුම්වත් කිරීම හා ඡන්දහිමියන්ගේ දිනයට අදාළ කාර්යයන් සම්බන්ධිකරනය කිරීම.
- ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන හා යොවුන් පාර්ලිමේන්තු වැඩසටහනට අදාළව, ඒ ඒ රාජ්‍ය ආයතන හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල නිලධාරීන් සම්බන්ධීකරණය.
- ආබාධිත ප්‍රජාව ඡන්ද විමසීම් ක්‍රියාවලියට සක්‍රීය ලෙස සම්බන්ධ කරගැනීමට අදාල කාර්යයන් හා ආන්තික ජන කොටස් ලියාපදිංචියට අදාල කටයුතු.

### II.I. තොරතුරු තාක්ෂණ අංශය

- තොරතුරු තාක්ෂණ භාවිතයෙන් ආයතනයේ කටයුතු කාර්යක්ෂමව කරගැනීමටත් පාර්ශව කරුවන්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ සේවාවන් ලබා දීමටත්, තොරතුරු තාක්ෂණ අවශ්‍යතා අධ්‍යනය, සැලසුම්කිරීම ව්‍යාපෘති වාර්තා සැකසීම හා අනුමත තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති ස්ථාපනය හා පවත්වාගෙන යෑම.
- මධ්‍යගත ඡන්ද හිමි නාමලේඛන දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම් හා පවත්වාගෙන යෑම
- මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය පරිපාලන හා තොරතුරු, යාවත්කාලීන කිරීම, ඉ-සේවා සැපයීම
- දත්ත මධ්‍යස්ථාන හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන යෑම

- පරිගණක ජාලය හා VPN ජාලය පවත්වාගෙන යෑම
- තොරතුරු තාක්ෂණ කටයුතු නිසි ආකාරව ඉටුකරගැනීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් පුහුණු කිරීම.
- සමාජ ජාල තොරතුරු පද්ධති පවත්වාගෙන යාම
- නිල ඉ ලිපින (e-mail) ජාලය පවත්වාගෙනයාම
- මැතිවරණ ප්‍රතිඵල සැකසීමේ කටයුතුවලට තාක්ෂණය යොදාගැනීම

## III. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ශාඛාව

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ කාර්යයන්
- පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ කාර්යයන්
- පළාත් පාලන ආයතන සභික ධූර පුරප්පාඩුව පිරවීමට අදාළ සම්බන්ධිකරණ කටයුතු හා පළාත් සභා මන්ත්‍රී ධුර පුරප්පාඩු පිරවීමට අදාළ කාර්යයන්.
- පළාත් පාලන ආයතනවල කොට්ඨාස සීමා නිර්ණය පිළිබඳ කටයුතු සම්බන්ධිකරණය කිරීම.
- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතේ සංශෝධන වලට අදාළ කාර්යයන්
- විදේශීය මැතිවරණ කළමනාකරණ ආයතන සම්බන්ධීකරණය
- දේශීය මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සම්බන්ධීකරණය
- රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධීකරණය
- තරුණ ප්‍රජාව ඡන්ද විමසීම් ක්‍රියාවලියට සක්‍රීය ලෙස දායක කර ගැනීමට අදාල කාර්යයන්

## IV. පාලන ශාඛාව

- මැතිවරණ කොමිෂන් සභාවේ සම්පත් කළමණාකරණය
- නිලධාරීන්ගේ විදේශ නිල සම්මන්ත්‍රණ හා පුහුණු වැඩසටහන්වලට අදාල කාර්යයන් සිදු කිරීම.
- නිර්මාණාත්මක ප්‍රවේශයක් තුළින් සැලසුම් පර්යේෂණ හා සංවර්ධනය සඳහා දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම සැලසුම් සකස් කිරීම.
- කාර්ය මණ්ඩලයේ දේශීය පුහුණුවීම් සහ ධාරිතා වර්ධනයට සම්බන්ධ කාර්යයන්.
- දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල සුභසාධක කටයුතු අධික්ෂණය කිරීම.
- මාණ්ඩලික නිලධාරීන්ගේ සාකච්ඡා පැවැත්වීම දිස්ත්‍රික් ලේකම් සාකච්ඡා හා ඊට අදාළ කටයුතු.
- භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.
- ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ක්‍රියාත්මක කිරීම හා ඡන්ද විමසීම් ක්‍රියාවලියෙහි දී කාන්තා නියෝජනය ශක්තිමත් කිරීම.

### IV.I. ආයතන අංශය

- මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු මාණ්ඩලික නොවන සියලුම නිලධාරීන්ගේ හා සේවකයින්ගේ පෞද්ගලික ලිපි ගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- ආරක්ෂක හා පවිත්‍රතා සේවාවන්ට අදාළ කටයුතු
- කාර්යාල නිලධාරීන්ගේ සුභ සාධන කටයුතු
- මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, ස්ථාන මාරු හා විශ්‍රාම ගැනීම්වලට අදාළ කටයුතු

### IV.II. ප්‍රවාහන අංශය

- කොමිෂන් සභාවේ රථ වාහන පරිපාලනයට අදාල කටයුතු

### IV.III. ප්‍රසම්පාදන අංශය

- ප්‍රසම්පාදන ක්‍රම මගින් භාණ්ඩ මිල දී ගෙන ගබඩා කිරීම හා අවශ්‍ය අංශ වෙත භාණ්ඩ නිකුත් කිරීම.
- ස්ථාවර වත්කම් ලේඛණය පවත්වාගෙන යාම
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීම.

## V. ගිණුම් ශාඛාව

- ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල මූල්‍ය කටයුතු අධීක්‍ෂණය හා ගිණුම් උපදෙස් ලබාදීම
- ආදායම් එකතු කිරීම
- සියලුම ගෙවීම් කටයුතු
- නිල බැංකු ගිණුම් මෙහෙයවීම
- වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම
- රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" පිළිබඳ කටයුතු
- සාමාන්‍ය පරිපාලන හා මැතිවරණ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සහ අක්මුදල් පාලනය
- මැතිවරණ වියදම් ඇස්තමේන්තු/ වියදම් වාර්තා පිළියෙල කිරීම
- වාර්ෂික විසර්ජන ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ කටයුතු
- පොදු තැන්පතු ගිණුම් පිළිබඳ කටයුතු
- ස්ථාවර වත්කම් පාලනයට අදාළ කටයුතු
- වැටුප් ගෙවීමේ වැඩසටහන (Payrool) පිළිබඳ කටයුතු
- සිගාස් වැඩසටහන (CIGAS) පිළිබඳ කටයුතු
- විගණන විමසීම්වලට පිළිතුරු සැපයීම, අයවැයකාරක සහා අවස්ථා කටයුතු හා රාජ්‍ය ගිණුම්කාරක සභාව සමග කටයුතු කිරීම.

## VI. නීති විමර්ශන හා පර්යේෂණ හා සැලසුම් ශාඛාව

- මැතිවරණ කොමිෂන් සභාවේ නීති කටයුතු සම්බන්ධව ක්‍රියා කිරීම.
- මැතිවරණ නීති සම්පාදනය පිළිබඳව කාර්යයන් සම්බන්ධීකරණය.
- දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම සම්බන්ධ කටයුතු.
- පිළිගත් දේශපාලන පක්ෂ ලැයිස්තුව වාර්ෂිකව සකස් කිරීම සහ එම පක්ෂවල සිදුවන සංශෝධන යාවත්කාලීන කිරීම.
- පිළිගත් දේශපාලන පක්ෂවල නිලධාරී මණ්ඩලයේ වත්කම් හා බැරකම් ප්‍රකාශ  වාර්ෂිකව ලබා ගැනීම හා වාර්ෂික ගිණුම් වාර්තා ලබා ගැනීම.
- පක්ෂ ලේකම්වරුන්ගේ හා නිත්‍ය නියෝජිතයන්ගේ රැස්වීම් පැවැත්වීමට අදාළ කාර්යයන් සංවිධානය කිරීම.
- පිළිගත් දේශපාලන පක්ෂවලට අදාළ පක්ෂ ලකුණු හා පක්ෂවලට වෙන්කර නොමැති ලකුණු ගැසට් නිවේදන මඟින් පළකිරීම.
- මැතිවරණ ආරවුල් කළමණාකරණයට අදාළ කටයුතු.
- මැතිවරණ කොමිෂන් සභාවේ 2022-2025 සිව් අවුරුදු උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයුම් හා ඇගයුම් සහ පසු විපරම් කිරීම.
- මැතිවරණ කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ප්‍රගති සමාලෝචන කටයුතු.
- දැනුම් කළමනාකරණ ඒකකය, ලේඛනාගාරය හා ප්‍රකාශන අලෙවි කවුළුව පවත්වාගෙන යාම.

### VI.I. මාධ්‍ය අංශය

- මාධ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රකාශන/ වාර සඟරා නිකුත් කිරීමට අදාල කටයුතු.

## VII. අභ්‍යන්තර විගණන ශාඛාව

- මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල අභ්‍යන්තර විගණන සිදුකිරීම හා වාර්තා සකස් කොට ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර විගණන වාර්තා මගින් මතුවන ගැටළු හා කරුණු පිළිබඳව අවධානය යොමුකොට සුදුසු පිළියම් යෝජනා කිරීම හා පසුවිපරම් කිරීම.
- මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයන්හි මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් හා පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමයට සම්බන්ධ වී එම කටයුතුවල අඩුපාඩු හා දුර්වලතා වැළැක්වීම.
- අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත්භාවය හා ප්‍රමාණාත්මකභාවය පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් සිදු කොට වඩාත් ඵලදායී අයුරින් පවත්වා ගනිමින් රාජ්‍ය සම්පත් මනා කළමනාකරණයකට ලක්කිරීමට කටයුතු කිරීම.

- ඡන්ද විමසීම් හා මැතිවරණ පවත්වන කාල සීමාවේ දී මැතිවරණ නීති රීති උල්ලංඝනය කිරීම් විමර්ශනය කිරීමට අදාළව පවරනු ලබන විශේෂ රාජකාරී.
- ඡන්ද විමසීම් කාලසීමාවේ දී ජාතික මැතිවරණ පැමිණිලි මධ්‍යස්ථානය හා ඒකාබද්ධව විමර්ශනය කටයුතු සිදු කිරීම.

## VIII. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල

- වාර්ෂික ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ දිස්ත්‍රික් මට්ටමේ කටයුතු සිදු කිරීම.
- ඡන්දහිමි නාමලේඛන උපුටන නිකුත් කිරීම.
- ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ කාර්යයන් සංවිධානය කිරීම හා ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ කටයුතු.
- පළාත් පාලන ආයතනවල සභික ධුර පුරප්පාඩු පිරවීමට අදාළ කටයුතු.
- ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා/ තොරතුරු ලබා දීම.
- ප්‍රජාතන්ත්‍රවාදය/ සර්වජන ඡන්ද බලය/ ශිෂ්‍ය හා යොවුන් පාර්ලිමේන්තුව/ කාන්තා, තරුණ, ආබාධිත කණ්ඩායම් සම්බන්ධව දැනුම්වත් කිරීම් සංවිධානය කිරීම හා අවශ්‍ය අවස්ථාවල දී ඒ වෙනුවෙන් වෙනත් ආයතන වෙත සම්පත්දායකත්වය ලබා දීම.
- අධිකරණ නියෝග මත අධිකරණ කටයුතු සඳහා අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීම.

## 13. මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

මැතිවරණ කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය, පහත සඳහන් තනතුරුධාරී නිලධාරී මණ්ඩලයකින් සමන්විත වේ. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සාමාජිකයින් පස් දෙනා හැරුණු විට මැතිවරණ කොමසාරිස් ජනරාල්, ලේකම් ඇතුළු මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (ශ්‍රී ලං.ප.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ (ශ්‍රී ලං.ග.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ (ශ්‍රී ලං.තො.ස.තා.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ (ශ්‍රී ලං.ක්‍ර.සේ.) නිලධාරීන්, නීති අධ්‍යක්ෂ හා නීති නිලධාරීන්, භාෂා පරිවර්තක නිලධාරීන් රාජ්‍ය කළමනාකරණ සේවයේ (රා.ක.ස.සේ. අධි ශ්‍රේණියේ) නිලධාරීන් හා මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලයේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්, තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරීන්, ලේඛන සහකාරවරුන්, කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන් ඇතුළත් වේ. ඒ අනුව 2021.09.30 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

| කාර්ය මණ්ඩලය | සංඛ්‍යාව | | පුරප්පාඩු |
|---|---|---|---|
| | අනුමත | සත්‍ය | |
| මාණ්ඩලික නිලධාරීන් (ශ්‍රී ලං.ප.සේ., ශ්‍රී ලං.ග.සේ., ශ්‍රී ලං.තො.ස.තා.සේ., ශ්‍රී ලං.ක්‍ර.සේ.,නීති අධ්‍යක්ෂ, නීති නිලධාරි, සම්බන්ධීකරණ ලේකම්, භාෂා පරිවර්තක, රා.ක.ස.සේ. අධි ශ්‍රේණියේ නිලධාරීන් ඇතුළුව) | 76 | 61 | 15 |
| රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරීන් | 390 | 361 | 29 |
| සංවර්ධන නිලධාරී | 27 | 26 | 01 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 14 | 13 | 01 |
| ලේඛන සහකාර | 52 | 46 | 06 |
| පිළිගැනීමේ නිලධාරී | 01 | 01 | - |
| කාර්යාල කාර්ය සහයක | 172 | *162 | - |
| රියදුරු | 53 | 43 | 10 |
| රිය ශෝධක | 01 | 01 | |
| එකතුව | 786 | 714 | 72 |

* රා.ප චක්‍රලේඛ 25/2014 අනුව බඳවා ගන්නා ලද 46 දෙනෙකු ද ඇතුළත්ව

සමාලෝචන කාලය තුළ දී සේවා උසස්වීම් මත මැතිවරණ කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු නොමැති වීම හා පෞද්ගලික හේතු මත මාණ්ඩලික නිලධාරීන් දස දෙනෙක් කොමිෂන් සභාවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා ගෙන තිබූ අතර මාණ්ඩලික නිලධාරීන් අට දෙනෙකු වෙනත් සේවා ස්ථානවල සිට කොමිෂන් සභාව වෙත ස්ථාන මාරුවීම් ලබා පැමිණ ඇත. මාණ්ඩලික නිලධාරී පුරප්පාඩු තනතුරු සඳහා වැඩ බැලීම හා රාජකාරී ආවරණය සඳහා අභ්‍යන්තර පරිපාලන වැඩපිළිවෙළක් යොදා ගෙන තිබුණි.

මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ ආයතන කටයුතු මතු දක්වා ඇත.

| | සේවය | සංඛ්‍යාව |
|---|---|---|
| මැතිවරණ කොමිෂන් සභාව වෙත ස්ථාන මාරු කිරීම් | කළමනාකරණ සේවා නිලධාරි සේවය | 12 |
| | ඒකාබද්ධ රියදුරු සේවය | 02 |
| මැතිවරණ කොමිෂන් සභාවෙන් නිදහස් කිරීම් | කළමනාකරණ සේවා නිලධාරි සේවය | 04 |
| | ඒකාබද්ධ රියදුරු සේවය | 04 |
| 2021.09.30 දිනට විශ්‍රාම යෑම් | කළමනාකරණ සේවා නිලධාරි සේවය | 05 |
| | ඒකාබද්ධ රියදුරු සේවය | 01 |
| | කාර්යාල සේවක සේවය | 01 |
| රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලැබීම මත නිදහස් කිරීම | කළමනාකරණ සේවා නිලධාරි සේවය | 04 |
| සේවයෙන් ඉල්ලා අස්වීම | කාර්යාල සේවක සේවය | 01 |

## II කොටස

# කාර්ය සාධනය 2022

## 1. උපාය මාර්ග සැලැස්ම (2022-2025) සකස් කිරීම.

මැතිවරණ කොමිෂන් සභාව විසින් සකස් කරන ලද 2017 - 2020 උපාය මාර්ග සැලැස්මේ ක්‍රියාත්මක කාලය මේ වන විට අවසන් ව ඇත. 2020 දෙසැම්බර් මස 10 වන දින දී පත් වූ දෙවන මැතිවරණ කොමිෂන් සභාව විසින් 2022 - 2025 කාලය සඳහා උපාය මාර්ග සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබ ඇත. ඒ අනුව පළමු සැලැස්මේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සමාලෝචනය කොට එහි ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ ක්‍රියාකාරකම් හඳුනා ගැනීම, තවදුරටත් ක්‍රියාත්මක කළ යුතුව පවතින ක්‍රියාකාරකම් හා අලුතින් එකතු කළ යුතු ක්‍රියාකාරකම් හඳුනාගැනීම පළමුව සිදු කෙරේ. මේ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරින්, තේරීම්භාර නිලධාරීන් හා අනෙකුත් පාර්ශ්වකාර කණ්ඩායම් සමඟ පවත්වනු ලබන සාකච්ඡා හා ඔවුන් වෙතින් ලද යෝජනා ද සැලකිල්ලට ගනු ලබන අතර මෙම සැලැස්ම 2021 දෙසැම්බර් අවසානයට පෙර සකස් කිරීම කොමිෂන් සභාවේ අපේක්ෂාවයි.

## 2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

මැතිවරණ කොමිෂන් සභාවේ එක් එක් අංශ විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව කාර්තුමය වශයෙන් ප්‍රගතිය සමාලෝචනය කොට ප්‍රගති වාර්තා සකස් කිරීම හා එම වාර්තා මුදල් අමාත්‍යාංශයට යොමු කිරීම කරනු ලබයි. මෙම වර්ෂයේ දී ප්‍රගති සමාලෝචන රැස්වීම් දෙකක් පමණක් පවත්වා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම්වල ප්‍රගතිය විමර්ශනය කිරීම හා නියමිත ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

## 3. මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම්

මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම් සේවා අවශ්‍යතාව ද සැලකිල්ලට ගෙන 2021 වර්ෂයේ මුල් කාර්තුවෙහි රැස්වීම් 08 ක් ද, දෙවන කාර්තුව සඳහා රැස්වීම් සංඛ්‍යාව 07 ක් ද තෙවන කාර්තුව සඳහා රැස්වීම් 08 ක් ද පවත්වන ලදී. මේ අනුව 2021.09.30 දින දක්වා පවත්වන ලද මුළු රැස්වීම් සංඛ්‍යාව 23 කි. කොමිෂන් සභාවේ පාලන, ජාතික මැතිවරණ , පළාත් පාලන ඡන්ද විමසීම්, නීති විමර්ශන හා සැලසුම්, ගිණුම් ශාඛාව හා ඒ යටතේ ඇති විවිධ අනු අංශ මගින් ඉදිරිපත් කරනු ලබන කොමිෂන් පත්‍රිකා ආශ්‍රිතව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, මඟ පෙන්වීම හා උපදෙස් හා නියෝග නිකුත් කිරීම කොමිෂන් සභා රැස්වීම්වල දී සිදු කරනු ලැබේ. පවත්නා කොවිඩ් -19 වසංගත රෝග තත්ත්වය යටතේ, ඉටු කළ යුතු ව්‍යවස්ථාපිත මෙන්ම, සාමාන්‍ය රාජකාරි කටයුතු උපරිම මට්ටමින් ඉටු කිරීමට හැකිවීම සතුටට කරුණකි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (3) හි දැක්වෙන පරිදි මැතිවරණ කොමිෂන් සභාව විසින් එක් එක් ලිත් වර්ෂයේ දී සිදු කරන ලද ස්වකීය කටයුතු පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සිදු කර ඇත.

4. **නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමට පත්කොට ඇති කමිටුව වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා.**

- පුරවැසියාගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සෘජුවම මූලික අයිතිවාසිකමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැනටමත් සඳහන්ව ඇති ඡන්ද විමසීම් වන්නේ ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය හා ජනමත විචාරණය පමණක් වන නිසා ඊට අමතරව පළාත් සභා හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම.
- ඡන්ද විමසීමක්/ මැතිවරණයක් තරග කරනු ලබන සෑම අපේක්ෂකයකු විසින්ම එකී ඡන්ද විමසීම/ මැතිවරණය සඳහා ඔහු හෝ ඇය විසින් සිදු කරන ලද සැබෑ වියදම හා ආදායම් මූලාශ්‍ර ඇතුළත් ප්‍රකාශනයක් ඡන්ද විමසීම/ මැතිවරණය අවසානයේ ප්‍රතිඵල නිකුත් කොට දින 30ක් ඇතුළත මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම අනිවාර්යය කිරීම හා එය ප්‍රසිද්ධියට පත් කිරීමට කොමිෂන් සභාවට බලය පැවරීමත් එසේ ඉදිරිපත් කරනු ලබන වියදම් වාර්තාව නියමිත කාලය තුළ ලබා නොදීම හෝ සාවද්‍ය කරුණු ඇතුළත් කොට තිබීම හෝ දෝෂ සහිත නම් ඔහුගේ /ඇයගේ මන්ත්‍රී ධුරය/සභික ධුරය අහෝසි කිරීම හා පරාජිත අපේක්ෂකයකු සම්බන්ධයෙන් නම් එම ක්‍රියාව මැතිවරණ වරදක් සේ සලකා කටයුතු කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබා දීම.
- පාර්ලිමේන්තුවට තේරීපත් වූ යම් මන්ත්‍රීවරයකු ස්වකීය ධුර කාලයේ පළමු වර්ෂ 02 තුළ යම් රෝගී තත්ත්වයක් හෝ වෙනත් සුවිශේෂී සාධාරණ හේතුවකින් තොරව එම කාලය තුළ පවත්වනු ලැබූ මුළු පාර්ලිමේන්තු සභා රැස්වීම් දින ගණනින් අවම වශයෙන් 1/3කට වත් නොපැමිණියහොත් එම මන්ත්‍රීවරයන්ගේ ඉදිරි ධුර කාලය අහෝසි කිරීම.
- ජනමත විචාරණයක දී දැනට පවතින්නේ එක් නිශ්චිත කරුණක් පිළිබඳව ජනමතය විමසීම පමණක් වන නිසා යම් පනතක යම් නිශ්චිත කාර්යයන් කිහිපයක් සම්බන්ධයෙන් විධානයක් හෝ විධාන කිහිපයක් සඳහා ජනතා අදහස් ලබා ගත හැකි වන පරිදි ඊට අදාළව පවත්නා වගන්ති සංශෝධනය කිරීම.
- පාර්ලිමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරයකු හෝ සභිකයකු විසින් සිදු කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් මගින් වරදකරුවකු කළ පසු එම මන්ත්‍රීවරයා හෝ සභිකයා එම මන්ත්‍රී ධුරය හෝ සභික ධුරය දැරීමට නුසුදුස්සකු වන්නේ නම් එම අවස්ථාව විමර්ශනය කොට මන්ත්‍රී ධුරයෙන් හෝ සභික ධුරයෙන් එම තැනැත්තා ඉවත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය පැවරීම.
- යම් දේශපාලන පක්ෂයක් විසින් පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා පත්‍රය සමග ජාතික ලැයිස්තුව සඳහා ද නාම යෝජනා පත්‍රයක් ලබා දිය යුතු බවත් එම ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුර ඡන්ද විමසීමෙන් දින 07 ක් ඇතුළත නම් කිරීම සිදු නොකරන්නේ නම් මැතිවරණ කොමිෂන් සභාව වෙත භාර දී ඇති ජාතික ලැයිස්තු නාම යෝජනා පත්‍රයේ නම් සඳහන් ප්‍රමුඛතා අනුපිළිවෙලට මන්ත්‍රී ධුර ගැසට් පත්‍රයේ පළ කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය ලබා දීම.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින්ම තරුණ හා කාන්තා නියෝජනයේ යම් ප්‍රතිශතයක් පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන අපේක්ෂක නාම යෝජනා සඳහා ඇතුළත් කිරීමට අදාළ විධි විධාන සැලසීම.

## 5. මැතිවරණ නීති සංශෝධනයට පත් කරන ලද පාර්ලිමේන්තු තේරීම්කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද යෝජනා

දැනට පවත්නා මැතිවරණ නීති වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමේ අවශ්‍යතාව දීර්ඝ කාලයක් තිස්සේ පාර්ශ්වකරුවන් විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ පිළිබඳව අවධානය යොමු කළ මැතිවරණ කොමිෂන් සභාව විසින් අදාළ නීති සංශෝධනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ පැවති සාකච්ඡාවේ දී දැනුවත් කරන ලද අතර ඊට ප්‍රතිචාර වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා විසින් මැතිවරණ නීති සංශෝධනය කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවක් පත් කිරීමට කටයුතු කර ඇත. එම තේරීම් කාරක සභාව සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවල සාරාංශයක් මතු දක්වා ඇත.

- **දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය**

  ලංකාවේ ලියාපදිංචි ඡන්ද දායක සංඛ්‍යාව හා සංසන්දනාත්මකව බලන කල දැනට ලියාපදිංචි දේශපාලන පක්ෂ සංඛ්‍යාව ඉතා ඉහළ අගයක් ගෙන තිබෙන අතර එය මැතිවරණ කළමනාකරණයට සංකීර්ණ තත්ත්වයක් හෙයින් මෙම දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය සලකා බලා සුදුසු සංශෝධන සිදු කිරීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා පහත දැක්වෙන ප්‍රධාන කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇත.

  - දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම හා පිළිගැනීමේ ක්‍රමවේදය ප්‍රදේශිය දේශපාලන පක්ෂ, ලියාපදිංචි දේශපාලන පක්ෂ හා පිළිගත් දේශපාල පක්ෂ වශයෙන් වර්ගීකරණය කිරීම.
  - මහජන නියෝජිතයන් ලෙස තේරී පත්වීම මත දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම
  - දේශපාලන පක්ෂ ව්‍යවස්ථා
  - දේශපාලන පක්ෂ සන්ධාන ගත වීම හා සන්ධාන පක්ෂයක් ලෙස පිළිගැනීම.
  - දේශපාලන පක්ෂ කිහිපයකින් සැදුම්ලත් සන්ධානයක බලාත්මක කාලය
  - සන්ධාන වශයෙන් තරග කිරීම

- **ඡන්ද ක්‍රමයේ කළ යුතු සංශෝධන**

  පාර්ලිමේන්තු හා පළාත් සභා ඡන්ද විමසීම් සඳහා දැනට පවත්නා සමානුපාතික නියෝජන හා මනාප ක්‍රමය පිළිබඳව ජනතා විශ්වාසය බොහෝ දුරට බිඳ වැටී තිබේ. එසේම පක්ෂ හා අපේක්ෂකයන් අතර ද ගැටුම් ඇති වන ඡන්ද ක්‍රමයක් හෙයින් විකල්ප ඡන්ද ක්‍රම හඳුන්වා දීම මැතිවරණ කොමිෂන් සභාවේ අපේක්ෂාව වේ. කේවල හා සමානුපාතික ප්‍රතිශතය ලෙස විවිධ නියෝජනයන්ට ඉඩ ලැබෙන සාධාරණ ප්‍රතිශතයක් සහිත මිශ්‍ර සමානුපාතික නියෝජන ක්‍රමය වඩා ප්‍රශස්ත මැතිවරණ ක්‍රමයක් ලෙස මැතිවරණ කොමිෂන් සභාව සලකනු ලැබේ.

- **මැතිවරණ දින නියම කිරීමට හා අවශ්‍යතාව පරිදි කල් දැම්මේ බලය මැතිවරණ කොමිෂන් සභාවට ලබා ගැනීම.**

  එකම පනතකින් ක්‍රියාත්මක වුව ද කඩින් කඩ මැතිවරණ/ ඡන්ද විමසීම් පැවැත්වීම වෙනුවට එක් නිශ්චිත දිනයක දී පැවැත්වීම හා සෑම මැතිවරණයකම/ ඡන්ද විමසීමකම දින නියම කිරීම් හා ප්‍රායෝගික තත්ත්වය මත අවශ්‍යතාව පරිදි කල් දැමීමේ බලය මැතිවරණ කොමිෂන් සභාව සතු විය යුතු බව

- **පූර්ව ඡන්ද ප්‍රකාශ කිරීම** (Advance Voting and Special Poling Station)

  ජනමාධ්‍යවේදීන්, නිරීක්ෂණ සංවිධාන හා වෙනත් අත්‍යාවශ සේවාවන් සඳහා දැනට ක්‍රියාත්මක තැපෑලෙන් ඡන්දය දීමේ ක්‍රමය යටතේ පහසුකම හිමි රාජ්‍ය, ව්‍යවස්ථාපිත හා අත්‍යාවශ්‍ය රැකියා ක්ෂේත්‍ර ප්‍රමාණය පුළුල් කිරීම හෝ පූර්ව ඡන්ද විමසීම් දිනයක් පැවැත්වීම හා ඡන්ද විමසීම් දිනයේ විශේෂ ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජනා කරනු ලබයි.

- **විද්‍යුත් ඡන්ද සලකුණු ක්‍රමය හඳුන්වාදීමේ වැදගත්කම**

  ඡන්ද පත්‍රිකා මගින් ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවට බොහෝ කලක සිට යෝජනා කරනු ලබන විද්‍යුත් ඡන්ද සලකුණු කිරීමේ යන්ත්‍ර (EVM) හඳුන්වාදීම.

- **පවත්නා ඇප මුදල් සංශෝධනය පිණිස වූ යෝජනා**

  සියලුම මැතිවරණ/ ඡන්ද විමසීම් පනත්වල සඳහන් ඇප මුදල් දක්වා ඇත්තේ අදාළ පනත් පළමුවරට හඳුන්වා දී තිබෙන වර්ෂයේ මට්ටම හා සමපාත වෙමිනි. තරග කරනු ලබන පක්ෂ/ අපේක්ෂක සංඛ්‍යාව ඉහළ යාම අනුව මැතිවරණ කළමනාකරණයේ දී ඇතිවන ගැටළු අවම කිරීම සඳහා වර්තමානයට ගැලපෙන පරිදි ඇප මුදල් සංශෝධනය කිරීමට සලකා බැලීම.

- **ඇප තැන්පත් කිරීමේ කාලවකවානු සංශෝධනය කිරීම**

  පරිපාලනමය හා ව්‍යවස්ථාපිත කරුණු මත මෙම කාර්යයන් වඩාත් පහසු කරවනු පිණිස ඇප මුදල් භාර ගැනීමේ දින වකවානු සංශෝධනය කිරීම.

- **නාමයෝජනා පරිපාටියට අදාළ දින වකවානු සංශෝධනය කිරීම**

  පසුගිය අත්දැකීම් අනුව නාමයෝජනා භාර දීමේ දී 95% පමණ ප්‍රතිශතයක් වාර්තා වී ඇත්තේ අවසන් දින දෙකක කාලය තුළ දීය. එ බැවින් ඒ සඳහා දැනට වෙන්කර තිබෙන දින ගණන දින තුනකට සීමා කිරීම හා හතරවන දිනයක් පනවා එදින තේරීම්භාර නිලධාරි තිරණ දැනුම් දීමට වෙන් කිරීම.

- **අපේක්ෂකයන්ගේ නුසුදුසුකම්**

  අපේක්ෂකයන් නුසුදුසු ක්‍රමයකට යටත් නොවන බවට වූ දිවුරුමක් ලබා ගැනීමත් එයට අනුව ඔහු/ ඇය නුසුදුසුකමකට යටත් වේ නම් අදාළ තැනැත්තාගේ පමණක් නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීම හා අසත්‍ය තොරතුරු ප්‍රකාශ කොට ධුර ලබා ඇත්නම් නිසි විමර්ශනයකින් අනතුරුව එම ධුර වලින් ඉවත් කිරීම.

- **තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීමේ දින වකවානු සංශෝධනය කිරීම**

  පූර්ව අත්දැකීම් අනුව විවිධ අවස්ථානුගත කරුණු හේතුවෙන් තැපැල් ඡන්ද භාරගැනීමේ දින වකවානු විටින් විට කල් දැමීම සිදු කොට ඇත. එබැවින් තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම මෙම කාල සීමාව නාමයෝජනා භාරගැනීම අවසන් වන දිනට පසු දින දක්වා සංශෝධනය කිරීම.

- **ඡන්ද දායකයා පරීක්ෂා කිරීම හා උචිත ලකුණු සලකුණු කිරීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීම**

  ඡායාරූප හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය කර තිබෙන හෙයින් මෙම ක්‍රියාවලිය තවදුරටත් සිදු කිරීම ප්‍රයෝගික ද යන්න සලකා බැලීම.

- **නිල ඡන්ද දැන්වීම් පත් බෙදාහැරීම**

  මේ සම්බන්ධයෙන් දැනට පවත්නා ක්‍රමවේදය සඳහා අධික වියදමක් හා මිනිස් ශ්‍රමය වැය වන බැවින් වඩාත් පහසු හා අවම වියදම් සහිත විකල්ප ක්‍රමවේද කෙරෙහි යොමු වීමේ වැදගත්කම.

- **ඡන්ද විමසීම අවසන් වන වේලාවේ දී පෝලිමේ සිටින සියලුදෙනාට ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව ලබා දීම සම්බන්ධ යෝජනාව**

  විවිධ දුෂ්කරතා හේතුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නියමිත වේලාව අවසන් වීමට පෙර පෝලිමට එක්ව සිටින සියළුම තැනැත්තන්ට ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව ලබාදීම.

- **මැතිවරණ ආරවුල් කළමනාකරණය හා නීති බලාත්මක කිරීමට අදාළ සංශෝධන**

  නිදහස් සහ සාධාරණ ඡන්ද විමසීමක් සඳහා වන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවට මැතිවරණ වැරදි සම්බන්ධ නඩු පැවරීමේ බලය ලබා දීම හා පොලිසිය වෙත දැනට පවත්නා නීතිය යටතේ තිබෙන බලතල තවදුරටත් පුළුල් කිරීම.

- **මැතිවරණ වියදම් පාලනයට නීති හඳුන්වාදීම**

  පක්ෂ/ අපේක්ෂකයින් විසින් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා විශාල වශයෙන් මුදල් වැය කොට නියෝජිතයින් ලෙස තේරී පත් වීම වැළැක්වීම පිණිස දැනටමත් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති, නීතිපතිවරයා විසින්ද එකඟතාවය පළ කර ඇති මැතිවරණ වියදම් පාලන පනත් කෙටුම්පත, පනතක් ලෙස සම්මත කිරීම හෝ අවම වශයෙන් වෙනත් විකල්ප වියදම් පාලන ක්‍රම හඳුන්වා දීම සඳහා නීති සංශෝධනය කිරීම.

- **කාන්තා හා තරුණ නියෝජනය ශක්තිමත් කිරීම**

  රටේ පාලන බලයට හවුල් වීම සඳහා තරුණ හා කාන්තා නියෝජනය සඳහා නිශ්චිත ප්‍රතිශතයක් ලබා දීමට අවශ්‍ය නීති රීති හඳුන්වා දීම.

- **නිදහස් දේශපාලන ගුවන් ප්‍රචාර හා රූපවාහිනී ප්‍රචාර ලබා දීම අහෝසි කිරීම.**

  ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණ පනත් වල දැක්වෙන විධිවිධාන අනුව රාජ්‍ය මාධ්‍ය වෙත පමණක් ක්‍රියාත්මක වන මෙම නීතිය තුළින් එකී රාජ්‍ය ආයතනවල මූල්‍ය තත්වයට අහිතකර බලපෑම් ඇති කරනු ලබන හෙයින් එම නීති සංශෝධනය කිරීම.

- **මාධ්‍ය උපමාන බලාත්මක කිරීම**

  නිදහස් සහ සාධාරණ ඡන්ද විමසීමක පැවැත්වීම සඳහා ජනමාධ්‍යයට ඇති බලපෑම සුළු පටු නොවේ. එබැවින් මාධ්‍ය නිදහසට බාධා ඇති නොවන පරිදි ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී මාධ්‍ය උපමාන බලාත්මක කිරීමට අවශ්‍ය නීති රීති හඳුන්වා දීම හා ඒවා බලාත්මක කිරීම.

- **මැතිවරණ කාලසීමාවේ ප්‍රචාරක කටයුතු තහනම් කිරීම**

  මැතිවරණ කාලසීමාවේ දී මාධ්‍ය ආයතන පක්ෂ/ අපේක්ෂක ප්‍රචාරය සඳහා අය කරනු ලබන මුදල් අසීමාන්තිකව වැඩි කිරීම සිදු වේ. පවතින ප්‍රචාරක ක්‍රමවේද හා නීති වර්තමානයට ගැළපෙන පරිදි සංශෝධනය කිරීම.

- **රාජ්‍ය සම්පත් අවභාවිතාව වැළැක්වීමට අදාළ යෝජනා**

  යම් පක්ෂයක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනයට හෝ අගතියට පත්වන පරිදි රාජ්‍ය සම්පත් අවභාවිතාව කිරීම නිදහස් සහ සාධාරණ ඡන්ද විමසීමකට බාධාවක් හෙයින් ඒ සම්බන්ධව නිකුත් කරනු ලබන විධාන කඩකිරීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අමතරව මැතිවරණ වරදක් ලෙසද සලකා මැතිවරණ නීතිය යටතේ වගකීමට යටත් කිරීම.

- **වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදීම අනිවාර්ය කිරීම**

  අපේක්ෂකයින්ගේ වත්කම්/ බැරකම් ප්‍රකාශ නාමයෝජනා පත්‍රය සමඟ භාර දීම අනිවාර්ය කිරීම හා ඒ තුළින් පසු අවස්ථාවක දී වැරදි හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම වළක්වාලීම හා එසේ සිදු කර තිබේ නම් එම තැනැත්තන්ට ධුරය අහිමිව වන ලෙස හා විරුද්ධව ක්‍රියා කිරීම සඳහා නිති සම්පාදනය කිරීම.

- **මැතිවරණ විනිශ්චය අධිකාරියක් ඇති කිරීමට වූ යෝජනාව**

  මැතිවරණ වැරදි, දේශපාලන පක්ෂ ආරවුල් හා නාමයෝජනා නාමයෝජනා සම්බන්ධව ගැටලු කඩිනමින් විසඳා ගැනීම සඳහා සහ දැනට මැතිවරණ සම්බන්ධව පවත්නා නඩු විභාග වල ප්‍රමාදය වළක්වාලීම පිණිස මැතිවරණ විනිශ්චය අධිකාරියක් පිහිටුවීමට යෝජනා කිරීම.

- **පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ක්‍රමවේදයේ අත්‍යාවශ්‍ය සංශෝධන**

  පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරිය) සම්බන්ධ ගැටලු රාශියක් පැනනැගී අතර, ඒවා කඩිනමින් විසඳා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ඇතුළත් යෝජනා.

- **පළාත් සභා ඡන්ද විමසීම කඩිනමින් පැවැත්වීම : (ඉදිරියේ දී විස්තර කොට ඇත)**

- **මැතිවරණ රාජකාරි කටයුතුවල යෙදෙන කාර්ය මණ්ඩල නාමකරණය සංශෝධනය කිරීම**

  ඡන්ද විමසීම්වල දී ඡන්ද පොළ හා ඡන්ද ගණන් කිරීමේ කාර්යයවල යොදා ගනු ලබන නිලධාරීන්ගේ තනතුරු නාම වූ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ ලිපිකරු යන තනතුරු නාම වෙනුවට ඡන්ද ස්ථානභාර නිලධාරී/ සහකාර ඡන්ද නිලධාරීන්/ ඡන්ද කටයුතු සේවා සහායක ආදී වශයෙන් හා ඡන්ද ගණන් කිරීමේ නිලධාරී වශයෙන් සංශෝධනය කිරීම.

- **මහජන නියෝජිතයයන්ගේ ධුර කාලය තුළ ආපසු කැඳවීම (Recall)**

  යම් මැතිවරණක දී/ ඡන්ද විමසීමක දී ජනතාව විසින් තෝරාපත් කරගනු ලබන මහජන නියෝජිතයින් ජනතා අරමුණුවල ට පටහැනි හා නීති විරෝධී අයුරින් කටයුතු කරන්නෙ නම් එකී මහජන නියෝජිතයින් නැවත කැඳවීමේ ක්‍රමවේදයක් ඇති කිරීම සඳහා වූ නීති සම්පාදනය කිරීම.

- **පාර්ලිමේන්තු මන්ත්‍රී ධුර කාලය**

  පාර්ලිමේන්තුවට තේරී පත් වූ යම් මන්ත්‍රීවරයකු ස්වකීය ධුර කාලයේ පළමු වර්ෂ 02 තුළ යම් රෝගී තත්ත්වයක් හෝ වෙන යම් සුවිශේෂී හේතුවකින් තොරව එම කාලය තුළ පවත්වන ලද පාර්ලිමේන්තු සභා රැස්වීම්වලින් අවම වශයෙන් 1/3 කටවත් සහභාගී නොවුවහොත් එම මන්ත්‍රීවරයාගේ ඉදිරි ධුර කාලය අහෝසි කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම.

## 6. ඡන්ද හිමියන් ලියාපදිංචිය

සුදුසුකම් සැපිරූ සියලූ පුරවැසියන්ට ජාතිය, ආගම, භාෂාව, වර්ගය, කුලය, අධ්‍යාපනය, දේපළ හිමිකම, උපත, උපන් ස්ථානය, වත්පොහොසත්කම, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ආදී කිසිදු විශේෂත්වයකින් තොරව රටෙහි පාලන බලයට හවුල්වීමේ අයිතිය හා ඒ සඳහා නියෝජිතයින් තෝරා පත්කර ගැනීමට ඇති අයිතිය ලබාගත හැකි වනුයේ සර්වජන ඡන්ද බලය මගිනි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන ව්‍යවස්ථාව ප්‍රකාරව සර්වජන ඡන්දබලය සහතික කර ඇත. ''පරමාධිපත්‍ය ජනතාව සතු බවත්, එය අන්සතු කළ නොහැකි බවත්, පැවරිය නොහැකි බවත්, එකී පරමාධිපත්‍ය යන්නට පාලන බලතල, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය යන අංග ඇතුළත් වන බවත්'' එහි සඳහන් වේ.

ඒ අනුව රටේ පුරවැසියන්ට ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීමක දී, පාර්ලිමේන්තු මහ මැතිවරණයක දී, ජනමත විචාරණයක දී, පළාත් සභා ඡන්ද විමසීමක දී හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක දී තම ඡන්ද බලය ක්‍රියාත්මක කළ හැකිය. ඉහත සඳහන් ඡන්ද විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පුරවැසියන් අදාළ ඡන්ද විමසීමේ දී වලංගුව පවත්නා ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටීම අනිවාර්යය වේ.

මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම කටයුතු සිදුකරනු ලබනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා 1980 අංක 44 දරණ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ හා අදාළ සංශෝධන පනත්වල දැක්වෙන විධිවිධාන අනුව වේ.

### 6.1. ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය කරනු ලබන මූලික සුදුසුකම්

- ශ්‍රී ලංකික පුරවැසියකු වීම.
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන දිනය වන ජූනි මස 01 වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම. (ඒ අනුව 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට හැකියාව ඇත්තේ 2003.05.31 හෝ එදිනට පෙර උපන් තැනැත්තන්ටය.)
- ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචියට ඉල්ලුම් කරන ලිපිනයේ සාමාන්‍ය පදිංචිය තිබීම.

## 6.2. ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා නුසුදුසුකම්

- බල පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් බවට අධිකරණය මඟින් තීරණය වී තිබීම.
- අවුරුදු 02 ක සිරගත වීමට නියම වන වරදකට අධිකරණය මඟින් වරදකරුවකු වී මාස 06ක් හෝ ඊට වැඩි කාලයක් සිරගත වී සිටීම හෝ සිරගත වී සහ ඉන්පසු අවුරුදු 07ක කාලයක් ගත වී නොතිබීම.
- අල්ලස් චෝදනාවකට වරදකරු වී අවුරුදු 07ක කාලයක් ගත වී නොතිබීම.
- මැතිවරණ නීති උල්ලංඝනය කිරීම හේතුකොට ගෙන අධිකරණය විසින් වරදකරුවකු කර තිබීම.
- මහජන ආයතන දූෂණ වැලැක්වීමේ ආඥා පනත යටතේ වරදකරුවකු වී තිබීම.

## 6.3. 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය ක්‍රියාවලිය

කොවිඩ් 19 වසංගත තත්ත්වය පැතිර යාම සහ එම වසංගත තත්ත්වය පැතිරයාම අවම කිරීම සඳහා රජය විසින් වරින්වර නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම, සංචරණ සීමා පැනවීම සහ 2020.08.05 දින පැවැත් වූ පාර්ලිමේන්තු මැතිවරණය ආදී කරුණු හේතුවෙන් කොමිෂන් සභාව සැලසුම් කළ පරිදි ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කළ නොහැකි විය. 2020 අගෝස්තු 15 දින සිට ගණන් ගැනීමේ නිලධාරින් මගින් ගෙයින්ගෙට ගොස් ඡන්දහිමියන් ගණන් ගන්නා අකෘති (බීසී ආකෘති) බෙදාහැරීම ආරම්භ කරන ලදී. 2020 වර්ෂයේ දී දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ඡන්දහිමියන්ගේ දත්ත සහිත නව බීසී ආකෘති පත්‍රය ඡන්ද හිමියාට ලබාදෙනු ලබන කුවිතාන්සිය සමඟ මුද්‍රණය කරන ලදී.

එසේ වුවද කොවිඩ් 19 වසංගත තත්ත්වය වරින්වර උග්‍රවීම හේතුවෙන් ගණන් ගන්නා නිලධාරින්ට ගණන් ගන්නා පෝරම (බීසී ආකෘති) බෙදීම හා ඒවා නැවත එකතු කර ගැනීමට බාධා ඇතිවිය. කොළඹ, ගම්පහ, කළුතර, සහ යාපනය යන මැතිවරණ කොට්ඨාසවල හැර සෙසු මැතිවරණ කොට්ඨාශයන්හි ඡන්ද හිමි නාමලේඛනයෙන් ඉවත් කරන ("අ") හා ඇතුළත් කළ යුතු ("ආ") ලැයිස්තු ප්‍රදර්ශනය 2020 දෙසැම්බර් 23 දින ආරම්භ කර 2021 ජනවාරි 19 දින අවසන් කරන ලදී. කොළඹ,ගම්පහ,කළුතර, සහ යාපනය යන මැතිවරණ කොට්ඨාශවල " අ" සහ "ආ" ලැයිස්තු ප්‍රදර්ශනය 2021 ජනවාරි 05 දින ආරම්භ කර 2021 පෙබරවාරි 01 දින අවසන් කරන ලදී. ඉහත "අ" සහ "ආ" ලැයිස්තු ප්‍රදර්ශනයට සමගාමීව ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා හිමිකම් සහ විරෝධතා භාරගැනීම සිදු කරන ලද අතර අනතුරුව එකී හිමිකම් සහ විරෝධතා අයදුම්පත සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වන ලදී.

උතුරු පළාතේ අර්ධ වශයෙන් නැවත පදිංචි කිරීමේ කටයුතු කළ හා නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු නොකළ යාපනය, කිලිනොච්චිය සහ මන්නාරම යන දිස්ත්‍රික්කයන්හි ග්‍රාම නිලධාරි වසම් 26ක ඡන්දහිමියන් ගණන් ගැනීම 1988 වර්ෂයේ සිට ගෙයින් ගෙට ගොස් සිදු නොකරන ලදී. මෙම ප්‍රදේශවල ඡන්දහිමි නාම ලේඛනයේ සඳහන් තැනැත්තන් විශාල සංඛ්‍යාවක් ජීවත්ව නොසිටින බව වාර්තා වීම හේතුවෙන් 2020 වර්ෂයේ ප්‍රතිශෝධනයේ දී ජීවත්ව සිටින බව තහවුරු තැනැතැතන් පමණක් ලියාපදිංචි කිරීමටත් සෙසු තැනැත්තන් ලියාපදිංචිය සිදු නොකිරීමටත් කොමිෂන් සභාව තීරණය කරන ලදී.

මන්නාරම දිස්ත්‍රික්කයේ අවතැන් ඡන්දහිමියන් සම්බන්ධයෙන් විධිමත් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමෙන් අනතුරුව මන්නාරම දිස්ත්‍රික්කයේ පදිංචියක් ඇති බව තහවුරු කරන ලද තැනැත්තන් මන්නාරම දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරීමටත් මන්නාරම දිස්ත්‍රික්කයේ ලියාපදිංචිය ඉල්ලුම් කළ එහෙත් මන්නාරම දිස්ත්‍රික්කයේ පදිංචිය තහවුරු කිරීමට නොහැකි වූ බොහෝ දෙනෙකු පුත්තලම දිස්ත්‍රික්කයේ සත්‍ය වශයෙන් පදිංචි ලිපිනයේ ලියාපදිංචි කිරීමටත් කටයුතු කරන ලදී.

2020 ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීමේ කටයුතු දිස්ත්‍රික් මට්ටමින් අවසන් කර 2021.04.30 දින දිවයිනේ සියළු මැතිවරණ කොට්ඨාසවල ලියාපදිංචි කිරීමේ/ සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරින් විසින් සහතික කරන ලදී. ඒ පිළිබඳව 2021.05.01 දිනැති අංක 2225/52 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කිරීමටත් භාෂාත්‍රයෙන් පුවත්පත්වල දැන්වීම් පළ කිරීමටත් කටයුතු කර ඇති අතර මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීම මෙන්ම ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හා දිවයිනේ සියළුම ග්‍රාම නිලධාරි කාර්යාලවල මහජන ප්‍රදර්ශනය සඳහා තබන ලදී.

2017 අංක 10 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ(විශේෂ විධිවිධාන) පනත අනුව 2020 පරිපූරක නාමලේඛනය සකස් කිරීම පිළිබඳව අයදුම්පත් භාර ගැනීම 2021.05.04 දින සිට 2021.05.11 දක්වා සිදුකරන බවට අංක 2226/18 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය 2021.05.04 දින පළ කරන ලද අතර, ඊට අදාළ මාධ්‍ය නිවේදනය භාෂාත්‍රයෙන් පුවත්පත්වල පළ කිරීමට කටයුතු කරන ලදි. එසේම 2021.05.11 සිට 2021.05.24 දක්වා පරිපූරක නාමලේඛනයට නම් ඇතුළත් කරවා ගැනීම සඳහා වූ අභියාචනා කාලසීමාව පිළිබඳව අංක 2227/6 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ 2021.05.11 දින පළ කරන ලද අතර, ඊට අදාළ මාධ්‍ය නිවේදනය භාෂාත්‍රයෙන් පුවත්පත්වල පළ කිරීමට කටයුතු කරන ලදි. එසේම පරිපූරක නාමලේඛන සඳහා අයදුම්පත් වන්නි මැතිවරණ කොට්ඨාසයේ මන්නාරම දිස්ත්‍රික්කයට පමණක් ලැබී තිබූ අතර 2020 පරිපූරක නාම ලේඛනය 2021.05.25 දින වන්නි මැතිවරණ කොට්ඨාසයේ සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරින් මඟින් සහතික කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලද අතර, ඒ පිළිබඳ වූ ගැසට් නිවේදනයක් එදින එනම් 2021.05.25 හා අංක 2229/4 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කිරීමට හා භාෂාත්‍රයෙන් පුවත්පත්වල පළ කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදි. 2020 වර්ෂයේ මුළු ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව 16,436,059කි.

වාර්ෂික ඡන්දහිමි නාමලේඛනය සකස් කර සහතික කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 වැනි ව්‍යවස්ථාවේ (8) වැනි ව්‍යවස්ථාව යටතේ වූ නියමය පරිදි ක්‍රියා කිරීම සඳහා 2020 ඡන්දහිමි නාමලේඛනයේ ඒ ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව පදනම් කර ගෙන එක් එක් මැතිවරණ කොට්ඨාස සඳහා තෝරාපත් කරනු ලැබිය යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාව

2021.06.18 දිනැති අංක 2232/35 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. එම තොරතුරු මතු දක්වා ඇත.

| මැතිවරණ කොට්ඨාසයේ නම | එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව |
|---|---|
| 01 - කොළඹ | 19 |
| 02 - ගම්පහ | 19 |
| 03 - කළුතර | 10 |
| 04 - මහනුවර | 12 |
| 05 - මාතලේ | 5 |
| 06 - නුවරඑළිය | 8 |
| 07 - ගාල්ල | 9 |
| 08 - මාතර | 7 |
| 09 - හම්බන්තොට | 7 |
| 10 - යාපනය | 6 |
| 11 - වන්නි | 6 |
| 12 - මඩකලපුව | 5 |
| 13 - දිගාමඩුල්ල | 7 |
| 14 - ත්‍රිකුණාමලය | 4 |
| 15 - කුරුණෑගල | 15 |
| 16 - පුත්තලම | 8 |
| 17 - අනුරාධපුරය | 9 |
| 18 - පොළොන්නරුව | 5 |
| 19 - බදුල්ල | 9 |
| 20 - මොනරාගල | 6 |
| 21 - රත්නපුර | 11 |
| 22 - කෑගල්ල | 9 |
| **එකතුව** | **196** |

**6.4. 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය**

සෑම වසරකම ජුනි මස 01 දින සිට ඡන්දහිමි නාමලේඛනය ප්‍රතිශෝධන කටයුතු ක්‍රියාත්මක කිරීම අරම්භ වේ. මෙම කාර්යය දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරීමේ නිලධාරීගේ උපදෙස් පරිදි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මඟින් සිදුකරනු ලබන අතර ක්ෂේත්‍රය තුළ ඡන්ද හිමියන් ගණන් ගන්නා නිලධාරීන් ලෙස ග්‍රාම නිලධාරීවරුන් කටයුතු කරනු ලබයි.

සාමාන්‍යයෙන් ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ දී සෑම ගෘහයකටම ඡන්දහිමියන් ගණන් ගැනීමේ ආකෘතියක් (BC ආකෘතිය) බෙදා දී සංගණනයක් සිදුකරනු ලැබුවත්, රට තුළ වර්තමානයේ පවතින COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් පුරවැසියන්ගේ හා නිලධාරීන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව පිණිස 2021 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ දී, එසේ ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ආකෘති බෙදාදීමක් සිදු නොකිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තිරණය කරන ලදි. ඒ අනුව 2020 ඡන්ද හිමි නාමලේඛනයෙන් ඉවත් වන හා අලුතින් ඇතුළත් වන නම් ඇසුරින් පමණක් ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා 2021/ER නැමැති විශේෂ ආකෘතිය හඳුන්වා දී ඇත.

**6.5. පදිංචිය වෙනස් වීම හේතුකොටගෙන නව ලියාපදිංචිය සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය.**

සාමාන්‍ය පදිංචිය 2021 ජුනි මස 01 දිනට පෙර සංශෝධනය වී තිබේ නම් පමණක් 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ නව ලිපිනය යටතේ ලියාපදිංචි වීමට අවකාශය සලසා දී

තිබේ. ඒ සඳහා සුදුසුකම් ඇති තැනැත්තන් දැනට පදිංචි ලිපිනයට අදාල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයා හමුවී 2021/ER ආකෘති පත්‍රයක් ලබා ගෙන එය සම්පූර්ණ කර භාරදිය යුතු වේ. මෙම ආකෘතිය www.elections.gov.lk වෙබ් අඩවියෙන් ද බාගත කර හැකි ය. මෙම ආකෘතියේ පූර්ව ලියාපදිංචි විස්තර සඳහන් කිරීමට ඇති තීරුවෙහි එම විස්තර අනිවාර්යයෙන් සටහන් කිරීම කළ යුතු වේ. එසේම පූර්ව පදිංචි ස්ථානයෙන් පදිංචිය හැරයාමට අදාළව ග්‍රාම නිලධාරීවරයා විසින් නිකුත් කරන ලද ලිපිය ඉදිරිපත් කිරීම අනිවාර්යය නොවේ.

**6.6. 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී නොමැති තැනැත්තන් 2021 වර්ෂයේ දී ලියාපදිංචි විය යුතු ආකාරය.**

2020 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වී නොමැති තැනැත්තන් 2021 වර්ෂයේ දී ලියාපදිංචිවීම සඳහා වර්තමානයේ පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයා හමු වී 2021/ER ආකෘතියක් ලබාගැනීම හෝ මැතිවරණ කොමිෂන් සභාවේ www.elections.gov.lk වෙබ් අඩවියෙන් භාගත කොට එම ආකෘතිය නියමිත පරිදි සම්පූර්ණ කොට ග්‍රාම නිලධාරී වෙත භාරදීම කළ යුතු වේ. මෙම ආකෘතියෙහි ඔහු හෝ ඇය අවසන් වරට ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටි ලිපිනයෙහි විස්තර සටහන් කිරීමද සිදුකළ යුතු ය

**6.7. 2021 වර්ෂයේ දී වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන් ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි කිරීම.**

එමෙන්ම 2003.05.31 හෝ එදිනට පෙර උපන් තැනැත්තන්ට 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට හැකියාව පවතී. ඒ අනුව මෙම වර්ෂයේ දී වයස 18 සම්පූර්ණ වන තැනැත්තන් 2021/ER ආකෘතියක් සම්පූර්ණ කොට උප්පැන්න සහතිකයේ හා ජාතික හැඳුනුම්පතේ පිටපතක් සමඟ ග්‍රාම නිලධාරීවරයා වෙත භාර දිය යුතුවිය.

2021.10.21 දින සිට 2021.11.17 දින දක්වා 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයේ කෙටුම්පත ග්‍රාම නිලධාරී කාර්යාලවල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ප්‍රදර්ශනය කරනු ලැබේ. එමෙන්ම www.elections.gov.lk වෙබ් අඩවියේ ද එම විස්තර ප්‍රදර්ශනය කරනු ඇත. මෙම විස්තර ප්‍රදර්ශනය කරනු ලබන දින පිළිබඳ තොරතුරු මහජනතාව වෙත ප්‍රසිද්ධ දැන්වීම් මඟින් හා ජංගම දුරකථනයට එවනු ලබන SMS පණිවිඩයක් මඟින් දැනුම් දීමට මැතිවරණ කොමිෂන් සභාව ක්‍රියා කරන ලදී.

එමෙන්ම ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමට මාර්ගගත (Online) පහසුව ද මේ වන විට ලබා දී ඇති අතර ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට පිවිස (www.elections.gov.lk) එහි සඳහන් කොට ඇති උපදෙස් පරිදි ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීම සඳහා අවස්ථාව සලසා දී තිබේ.

**6.8. "අ" සහ "ආ" ලැයිස්තු කෙටුම්පත ප්‍රදර්ශනය කිරීම.**

2021 ඡන්ද හිමි නාමලේඛනයේ ඉවත් කිරීමට ("අ" ලැයිස්තුව) හා ඇතුළත් කිරීමට ("ආ" ලැයිස්තුව) නිර්දේශ කරන ලද නම් ලැයිස්තුවල කෙටුම්පත 2021.10.21දින සිට 2021.11.17 දින දක්වා ග්‍රාම නිලධාරී කාර්යාලවල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හා මැතිවරණ කොමිෂන් සභාවේ නිළ වෙබ් අඩවියේ ද ප්‍රදර්ශනය කෙරේ. යම් තැනැත්තෙකුගේ නම 2021

ඡන්ද හිමි නාමලේඛනය සඳහා ඇතුළත් වීමට නිර්දේශ වී නොමැති නම් ඒ සඳහා ඉල්ලීමක් හිමිකම් ආකෘතියෙන් මෙම කාලය තුළ සිදු කිරීමට අවස්ථාව සැලසේ.

**6.9. හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම.**

මෙසේ ER ආකෘති මගින් ලැබෙන ඉල්ලීම් ද සලකා විධිමත් "අ" සහ "ආ" ලැයිස්තු 2021.10.21 දින සිට 2021.11.17 දින දක්වා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ප්‍රදර්ශනය කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව 2021 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට සුදුසුකම් සපුරා තිබෙන එහෙත් ඒ සඳහා නිර්දේශ වී නොමැති පුද්ගලයින්ට හිමිකම් ඉල්ලීම සඳහා 2021.10.21 දින සිට 2021.11.17 දින දක්වා පදිංචියට අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු වේ. 2021.11.17 දිනයෙන් පසුව එකී ඉල්ලීම් හා විරෝධතා පිළිබඳව කාර්යාල හා ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම සිදුකෙරේ.

එසේම සුදුසුකම් නොමැති තැනැත්තෙකුගේ නම කෙටුම්පත් ඡන්ද හිමි ලැයිස්තුවට ඇතුළත් වී තිබෙන බව යම් අයෙකුට නිරීක්ෂණය වන්නේ නම් ඒ සඳහා විරෝධතාවක් නියමිත ආකෘතියෙන් දෙපිටපතකින් යුතුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත මෙම කාලය තුළ දීම ඉදිරිපත් කළ හැකි ය.

ඒ අනුව මෙම සියළුම ව්‍යවස්ථාපිත කාර්යයන් අවසානයේ දී 2021 ඡන්දහිමි නාමලේඛනය 2021 වර්ෂය නිම වීමට පෙර සහතික කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් කටයුතු සම්පාදනය කර ඇත.

## 7. 2019 හා 2020 මැතිවරණ කොට්ඨාස සහ පරිපාලන දිස්ත්‍රික්කය අනුව ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව

| මැතිවරණ කොට්ඨාසය හා පරිපාලන දිස්ත්‍රික්කය | ඡන්ද හිමියන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2020 | | 2019 | |
| කොළඹ | | 1,724,061 | | 1,709,209 |
| ගම්පහ | | 1,804,102 | | 1,785,964 |
| කළුතර | | 981,364 | | 972,319 |
| මහනුවර | | 1,140,168 | | 1,129,100 |
| මාතලේ | | 413,096 | | 407,569 |
| නුවරඑළිය | | 583,566 | | 577,717 |
| ගාල්ල | | 876,391 | | 867,709 |
| මාතර | | 664,030 | | 659,587 |
| හම්බන්තොට | | 499,586 | | 493,192 |
| යාපනය | | 563,193 | | 571,848 |
| යාපනය දිස්ත්‍රික්කය | 469,822 | | 479,584 | |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | 93,371 | | 92,264 | |
| වන්නි | | 290,169 | | 287,024 |

| | | | | |
|---|---|---|---|---|
| වවුනියාව දිස්ත්‍රික්කය | 123,785 | | 119,811 | |
| මන්නාරම දිස්ත්‍රික්කය | 85,948 | | 88,853 | |
| මුලතිව් දිස්ත්‍රික්කය | 80,436 | | 78,360 | |
| මඩකලපුව | | 419,345 | | 409,808 |
| දිගාමඩුල්ල (අම්පාර දිස්ත්‍රික්කය) | | 523,148 | | 513,979 |
| ත්‍රිකුණාමලය | | 293,607 | | 288,868 |
| කුරුණෑගල | | 1,360,627 | | 1,348,787 |
| පුත්තලම | | 628,640 | | 614,370 |
| අනුරාධපුර | | 701,827 | | 693,634 |
| පොළොන්නරුව | | 336,701 | | 331,109 |
| බදුල්ල | | 675,924 | | 668,166 |
| මොණරාගල | | 377,688 | | 372,155 |
| රත්නපුර | | 888,722 | | 877,582 |
| කෑගල්ල | | 690,101 | | 684,189 |
| පරිපූරක ලැයිස්තුව | | 3 | | 11 |
| **මුළු එකතුව** | | **16,436,059** | | **16,263,896** |

## 8. ඡන්දහිමි නාමලේඛනයේ තොරතුරු පරිගණක/ ජංගම දුරකථන මගින් ලබා ගැනීමේ වැඩසටහන

ඡන්දහිමි නාමලේඛනයේ තොරතුරු පරිගණක/ ජංගම දුරකථන මගින් ලබා ගැනීමේ නව සේවා හඳුන්වා දීම පිළිබඳව හා එම කාර්යය දියත් කිරීමේ උත්සවය 2021.10.26 දින මැතිවරණ කොමිෂන් සභාවේ දී පැවැත්වී ය. එහි දී ප්‍රථම තොරතුරු පත්‍රිකාව මැතිවරණ කොමිෂන් සභාවේ හිටපු සාමාජික ජීවන් ත්‍යාගරාජා මහතා වෙත නිකුත් කරන ලදි. මෙම ඉ-සේවාව තුළින් ඕනෑම ඡන්දහිමියකුට ඡන්දහිමි නාමලේඛනයේ ස්වකීය තොරතුරු කොමිෂන් සභාවේ වෙබ් අඩවියට පිවිස ලබා ගත හැකිය.



## 9. ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචියට සහාය වීම සඳහා දුරකථන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම.


2021 ඡන්දහිමි නාමලේඛන ලියාපදිංචි වීමේ දී මහජනතාවගෙන් ඉදිරිපත් වන විමසීම් හා ගැටලුවලට සහය වීමට සහ හිමිකම් ඉල්ලීම් තොරතුරු භාර ගැනීම සඳහා විශේෂ දුරකථන සහායක මධ්‍යස්ථානයක් මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ මහලේකම් කාර්යාලයේ ස්ථාපිත කරන ලද අතර මෙම සේවාව 2021.12.31 දින දක්වා ක්‍රියාත්මක වේ.



## 10. ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට පුරවැසියන් දැනුම්වත් කිරීමේ කෙටි පණිවුඩයක් යැවීම.

වාර්ෂිකව සිදු කෙරෙන ඡන්දහිමියන් ලියාපදිංචියට අදාළ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිය පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම සඳහා කෙටි පණිවිඩයක් සියළුම ජංගම දුරකථන ග්‍රාහකයන් වෙත ලැබීමට සලස්වන ලදී.

මේ තුළින් තමන්ගේ ලියාපදිංචිය පිළිබඳව තොරතුරු ජංගම දුරකථන භාවිතා කරන සියලුම පුරවැසියන්ට දැනගත හැකි වේ.



## 11. ඡන්ද හිමි නාමලේඛන උපුටන නිකුත් කිරීම.

ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී සිටින යම් තැනැත්තෙකුට පෙර වර්ෂයක ඡන්දහිමි නාමලේඛනයේ සහතික කළ පිටපතක් ලබා ගැනීම සඳහා තමා ලියාපදිංචි ලිපිනය අයත් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ගොස් අයදුම්පතක් ඉදිරිපත් කිරීම කළ යුතු විය. මෙම ක්‍රමය මහජන හිතකාමී නොවන බවට වටහා ගත් මැතිවරණ කොමිෂන් සභාව ඕනෑම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයක් වෙත අයදුම්පතක් ඉදිරිපත් කරන කුමන හෝ දිස්ත්‍රික්කයක ලියාපදිංචි තැනැත්තෙකුට ඡන්දහිමි නාමලේඛනයේ සහතික කළ උපුටනයක් ලබා දීම සඳහා ක්‍රමවේදයක් මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ අංශය විසින් සකස් කරන ලදී.

ඒ අනුව තොරතුරු තාක්ෂණ අංශය විසින් හඳුන්වා දෙන ලද පරිගණක මෘදුකාංගයක් ඔස්සේ අදාළ පහසුකම මහජනතාව වෙත ලබා දී ඇති අතර මේ වන විට මෙම කාර්යය සෑම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයකම ක්‍රියාත්මක වේ.

## 12. වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන්ට කඩිනමින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට කරන ලද 2021 අංක 22 දරන (සංශෝධිත) පනත සම්මත කිරීම.

ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය තහවුරු කරමින් ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි වීමට ඇති අවස්ථාව පුළුල් කිරීමත් ඒමගින් නිසි වයස් සම්පූර්ණ වූ වහාම ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමටත් එසේ ලියාපදිංචි වූ ඡන්ද හිමියන්ට එළඹෙන පළමු ඡන්ද විමසීමේ දී සිය ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව සලසා දීමත් සඳහා පියවර ගත යුතු බවට වූ මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රතිපත්තිය මෙම සංශෝධිත පනත සම්මත වීමෙන් සාක්ෂාත් විය. ඒ අනුව වාර්ෂිකව සිදු කෙරෙන ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරීම හා සුදුසුකම් ලත් පුරවැසියන් ඇතුළත් මැතිවරණ ක්‍රියාවලියක් යටතේ වයස අවුරුදු දහඅට (18) සම්පූර්ණ වන යෞවනයන්ට ඡන්දය භාවිත කළ හැකි වන සේ පරිපූරක ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරීම සඳහා නීති සැකසීමට 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත මගින් විධිවිධාන සලසා ඇති අතර, එම සංශෝධිත පනත 2022.02.01 දින සිට බලාත්මක වේ. එම පනත සම්මත වීම ප්‍රජාතන්ත්‍රවාදය අගයන බොහෝ පාර්ශ්වවල මහත් පැසසුමට ලක් වී ඇති බව සඳහන් කළ යුතු ව ඇත.

## 13. දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම.

වර්තමානයේ දී නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රමුඛතම ස්ථානයක් දේශපාලන පක්ෂ ක්‍රමය සඳහා හිමි වේ. දේශපාලන පක්ෂයක් යනු කිසියම් ප්‍රතිපත්තියක් මත රාජ්‍ය බලය ලබාගැනීම සඳහා උත්සාහ කරන දේශපාලන සංවිධානයකි. මෙම දේශපාලන ක්‍රියාකාරී සංවිධාන මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ ලෙෂ මැතිවරණ කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීමේ නෛතික විධිවිධාන 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ හත්වන වගන්තියේ දක්වා ඇත.

ඒ අනුව, යම් දේශපාලන ක්‍රියාකාරී සංවිධානයක් මැතිවරණ කොමිෂන් සභාවේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීමට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසට දන්වමින් සෑම වර්ෂයකම ජනවාරි මාසයේ 31 දිනට ප්‍රථම ප්‍රසිද්ධ දැන්වීමක් මැතිවරණ කොමිෂන් සභාව විසින් පළ කරනු ලැබේ. අදාළ ක්‍රියාකාරී සංවිධානය එම දැන්වීමේ සඳහන් නියමිත කාලය තුළ දී තම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු අතර, මෙම ක්‍රියාවලිය කුමන හෝ මැතිවරණයක් සඳහා දින ප්‍රකාශ කර ඇත්නම්, එම මැතිවරණ කාල සීමාව අවසන් වන තෙක් අත් හිටුවනු ලැබේ.

දේශපාලන ක්‍රියාකාරී සංවිධානය සිය ඉල්ලීම සමඟ, මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඡන්ද සලකුණු අතරින් තමන් තෝරා ගන්නා සලකුණක්, පක්ෂ ව්‍යවස්ථාව, අනිවාර්යයෙන්ම එක් මහජන නියෝජිතයෙක් හෝ ඇතුළත් පක්ෂ නිලධාරී ලැයිස්තුව, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශ, පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශය යන තොරතුරු සමඟ මෙම ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ දිනයට අවම වශයෙන් අවුරුදු හතරක කාලයකට පෙරාතුව අනිවාර්යයෙන් දේශපාලන කටයුතුවල නියැලී සිටි බවට හෝ අපේක්ෂකයන් දෙදෙනෙකු අතරින් අවම වශයෙන් එක් අපේක්ෂකයකු එම ඉල්ලීම් ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව පවත්වන ලද පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී ජයග්‍රහණය කර ඇති බව හෝ විවිධ පළාත් සභා පහකට නම් කරන ලද අවම වශයෙන් අපේක්ෂකයන් පස් දෙනෙකු අතරින් තිදෙනෙකු මෙම ඉල්ලීම් ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව පවත්වන ලද පළාත් සභා මැතිවරණයේ දී ජයග්‍රහණය කර ඇති බව යන තොරතුරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර, කොමිෂන් සභාව ඒ සම්බන්ධව සෑහීමකට පත්විය යුතු ය.

මේ පිළිබඳව සම්පූර්ණ තොරතුරු ඇතුළත් කොට 1987 අංක 01 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(9) උප වගන්තිය යටතේ වූ නිවේදනයක් අංක 2211/49 හා 2021.01.21 දිනැති අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලදී.

2021 වර්ෂයට දේශපාලන පක්ෂ ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත් කැඳවීම 2021.03.01 දිනෙන් අවසන් වූ අතර, 2021 වර්ෂය සඳහා ලියාපදිංචිය සඳහා දේශපාලන සංවිධාන 40 ක් විසින් අයදුම්පත් භාර දෙන ලදී. ඒ සම්බන්ධයෙන් වූ තොරතුරු මතු දැක්වේ.

- ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව - 40
- මූලික කරුණු සම්පූර්ණ නොවීම මත ප්‍රතික්ෂේප වූ සංඛ්‍යාව - 22
- සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ සංඛ්‍යාව - 18
- සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගීවිය නොහැකි බව දැන්වූ සංඛ්‍යාව - 03
- ප්‍රතික්ෂේප අයදුම්පත් සංඛ්‍යාව - 12
- කොමිෂන් සභාව වෙත යොමු කර ඇති සංඛ්‍යාව - 03

මේ වන විට මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගත් දේශපාලන පක්ෂ සංඛ්‍යාව 76කි. ඒ පිළිබඳව තොරතුරු අංක 2212/42 හා 2021 ජනවාරි 29 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද අතර මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ද පළ කොට ඇත.

## 14. පළාත් සභා ඡන්ද විමසීම

මේ වන විට සියලුම පළාත් සභාවල නිළ කාලය අවසන් වී ඇති අතර 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සහ 2017 අංක 17 දරන සංශෝධන පනත සම්මත වුවද පළාත් සභා කොට්ඨාස ක්‍රමය යටතේ පැවැත්වීම සඳහා පළාත් සභා මැතිවරණ කොට්ඨාශ සීමා නිර්ණය කරමින් සකස් කර ඇති වාර්තාව පාර්ලිමේන්තුවේ සම්මත නොවීම යන කරුණු හේතුවෙන් මේ වන තෙක් පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමේ හැකියාව ලැබී නැත.

ඒ අනුව දැනට ක්‍රියාත්මක වන පළාත් සභා සඳහා වසර ගණනාවක් තිස්සේ මහජන නියෝජිතයන් තෝරාපත් කර ගැනීමට නොහැකි වී තිබේ. මහජන නියෝජිතයන් ගෙන් තොරව පළාත් සභා ක්‍රියාත්මක වීම යහපත් තත්ත්වයක නොවන හෙයින් පළාත් සභා ඡන්ද විමසීම කඩිනමින් පැවැත්විය යුතු වන බව මැතිවරණ කොමිෂන් සභාවේ ස්ථාවරය වේ. ඒ සඳහා සුදුසු ඕනෑම ඡන්ද ක්‍රමයක් යටතේ එය පැවැත්වීම සඳහා සුදුසු නීතිමය සංශෝධනය කඩිනම් කර ඡන්ද විමසීම පැවැත්වීමට අවස්ථාව සලසන ලෙස මැතිවරණ කොමිෂන් සභාව ව්‍යවස්ථාදායකයේ අවධානයට ලක් කරමින් ඉල්ලා සිටී.

## 15. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම

මහ නගර සභා 24 ක්, නගරසභා 41 ක් සහ ප්‍රාදේශිය සභා 276 ක් වෙනුවෙන් සභිකයන් තෝරා ගැනීම සඳහා 2018 වර්ෂයේ පෙබරවාරි 10 දින පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සහ අධිකරණ ක්‍රියා මාර්ග හේතුවෙන් 2019 වර්ෂයේ ඔක්තෝම්බර් මස 11 දින පවත්වන ලද ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශය සභා ඡන්ද විමසීම වෙනුවෙන් දේශපාලන පක්ෂ 44 ක් ද, ස්වාධීන කණ්ඩායම් 222 ක් ද, නාමයෝජනා ලබාදෙන ලදී. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා අපෙක්ෂකයන් 57231 ක් ඉදිරිපත් වු අතර ඉන් 8711 ක් පළාත් පාලන ආයතන 341 සඳහා තේරී පත්විය.

මෙම තේරී පත්වු සභිකයන් 8711 අතුරින් පළාත් පාලන ආයතන කොට්ඨාස 4917 ක් සඳහා සභිකයන් 5077 ක් (60%) ද, 3634 ක් (40%) ක් අතිරේක අපේක්ෂකයන් වශයෙන් ද, එක් එක් පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් විසින් තෝරා පත්කර ගන්නා ලදී.

පළාත් පාලන ආයතනවල සභිකයන් මිය යාම, ඉල්ලා අස්වීම, පක්ෂ සාමාජිකත්වය අහිමි වීම සහ පාර්ලිමේන්තු මැතිවරණයට තරග කර ජයග්‍රහණය කිරීම යන හේතුන් මත සභික ධුර පුරප්පාඩු සිදුවූ අතර එම සභිකධුර පුරප්පාඩු පිරවීමේ නෛතික ක්‍රියාවලිය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විසින් ඉටු කරනු ලබන අතර එම කටයුතු සම්බන්ධීකරණය පළාත් පාලන ශාඛාව විසින් සිදුකරනු ලබයි.

ඒ අනුව, 2021 වර්ෂයේ තුන්වන කාර්තුව වන විට පළාත් පාලන ආයතනවල සභිකධුර පුරප්පාඩු 680 ක් වෙනුවෙන් සභිකයන් පත්කරීම සඳහා වන නෛතික ක්‍රියාවලිය සම්පූර්ණ කර ඇත.

**15.1. පළාත් පාලන සභිකධුරයන් හි පුරප්පාඩු පිරවීම**

| අනු අංකය | පුරප්පාඩු වීමට බල පෑ හේතුව | පුරප්පාඩු වී ඇති සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සභික ධුරයෙන් ඉල්ලා අස්වීම | 334 |
| 2 | සභිකයා මරණයට පත්වීම | 66 |
| 3 | සභිකයාගේ පක්ෂ සාමාජිකත්වය අහිමිවීම | 232 |
| 4 | සභික ධුරයේ දිවුරුම් නොදීම | 1 |
| 5 | සභාවාර සඳහා සහභාගී නොවීම | 35 |
| 6 | අධිකරණ ක්‍රියා මාර්ග හේතුවෙන් / ආණ්ඩුකාරවරයා විසින් ඉවත් කිරීමෙන් සභික ධුරය අහිමි වීම | 7 |
| 7 | පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වීමෙන් | 5 |

2018.02.10 දින පවත්වන ලද පළාත් පාලන ආයතනවල නිළ කාලය 2022 මාර්තු මස 19 වන දිනයෙන් අවසන් වීමට නියමිතව ඇති අතර, 2019.10.11 දින පවත්වන ලද ඇල්පිටිය ප්‍රාදේශිය සභාවේ නිළ කාලය 2023 වර්ෂයේ නොවැම්බර් මස 04 දිනයෙන් අවසන් වේ.

## 16. නීති කටයුතු

2021 වර්ෂයේ මුල් කාර්තු තුන තුළ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති, සාමාජිකයන් ඇතුළු නිලධාරීන් වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් අලුතින් ගොනු කරන ලද නඩු කටයුතු 47 ක් මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා වී ඇත.

- **ශ්‍රේෂ්ඨාධිකරණය**

  ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද නඩු කටයුතු 07 ක් වේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද නඩු අතරින් ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය ආශ්‍රිතව මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධව නඩු කටයුතු 01 ක් ද, දේශපාලන පක්ෂ ලියාපදිංචිය 2021 ට අදාළව නඩු කටයුතු 02 ක් ද, පක්ෂ සාමාජිකත්වය අවසන් කිරීමට අදාළ නඩු කටයුතු 02 ක් ද, පසුගිය ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණයට සමගාමී නඩු කටයුතු 02 ක් ද ගොනු කොට ඇත.

- **අභියාචනාධිකරණය**

  අභියාචනාධිකරණයේ ගොනු කර ලද නඩු කටයුතු 20 ක් ලැබී ඇති අතර, එම නඩු අතරින් පක්ෂ සාමාජිකත්වය අවසන් කිරීමට අදාළ නඩු කටයුතු 17 ක් ද, පළාත් පාලන ආයතනවල සභාපතිධුරයෙන් ඉවත් කිරීමට අදාළ නඩු කටයුතු 03 ක් ද වේ.

- **මහාධිකරණය**

  මහාධිකරණ නඩු අතරින් ලැබී ඇති නඩු 07 පක්ෂ සාමාජිකත්වය අවසන් කිරීමට අදාළ නඩු කටයුතු වේ.

- **දිසා අධිකරණය**

  දිසා අධිකරණයේ ගොනු කරන ලද නඩු සංඛ්‍යාව 13 ක් වන අතර, එම නඩු සියල්ලම පක්ෂ සාමාජිකත්වය අවසන් කිරීමට අදාළව ගොනු කර ඇත.

මීට පෙර වර්ෂවල දී ගොනු කරන ලද පෙත්සම්වලට අදාළව සංශෝධිත පෙත්සම් 37 ක් ද මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබී ඇත. ඉහත සියළු නඩු කටයුතු සහ සංශෝධිත පෙත්සම්වලට අදාළව මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජික මහතුන් ද, තේරීම්භාර නිලධාරීන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි ද නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. එමෙන්ම ඉහත නඩු කටයුතුවලට අදාළව මැතිවරණ කොමිෂන් සභාවේ නිරීක්ෂණ ද නඩු කටයුතු 28 ක් සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

2021 වර්ෂයේ ගොනු කරන ලද නඩු අතරින් නඩු කටයුතු 16 ක් මේ වන විට අවසන්ව ඇති බව හා පෙර වර්ෂවලට අදාළ නඩු කටයුතු 12 ක් ද අවසන් වී ඇති බව මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා වී ඇත.

මීට අමතරව විවිධ නෛතික තත්ත්ව පිළිබඳ නීතිපති උපදෙස් විමසීම් 06 ක් යොමු කර ඇත. එමෙන්ම ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව ජාතික මැතිවරණ ශාඛාව සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙතින් ලැබෙන ලිපි සඳහා නීති උපදෙස් ලබා දීම ද සිදු කරන ලදී. මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ලැබුණු පැමිණිලි 05 ක් සඳහා අදාළ පාර්ශ්ව වෙතින් තොරතුරු විමසීම් මේ වන විට සිදු කර ඇත. පසුගිය ඡන්ද විමසීම්වලට අදාළව ලේඛන අපහරණය කිරීම, බී.සී. පත්‍රිකා අපහරණය කිරීම සම්බන්ධව උපදෙස් විමසමින් ලැබෙන ලිපි සඳහා උපදෙස් ලබා දීම සිදු කරන ලදී. එමෙන්ම දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණවල විභාග වන නඩු කටයුතු සඳහා සාක්ෂි ලබා දීම සම්බන්ධ සිතාසි අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත යොමු කිරීම සහ ඊට අදාළ උපදෙස් ලබා දීම සිදු කර ලදී.

නීති සංශෝධන කටයුතුවලට අදාළව මැතිවරණ වියදම් පාලනය සඳහා වන පනත් කෙටුම්පත හා ඇප මුදල් සංශෝධනයට අවශ්‍ය යෝජනා ඉදිරි කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇත.

## 17. ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් ඇති වගකීම

මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම අනුව සර්ව ජන ඡන්ද බලය සුරක්ෂිත දේශයක් උදෙසා ආන්තිකරණයට ලක් වූ ප්‍රජාව ඇතුළත් වූ මැතිවරණ ක්‍රියාවලියක් සහතික කිරීම සහ ආබාධ සහිත පුද්ගලයන්ගේ ඡන්ද අයිතිය සෙසු පුරවැසියන් හා සමාන සහ සාධාරණ පදනමකින් බුක්තිවිඳීමේ අයිතිය තහවුරු කිරීම කළ යුතු වේ.

### 17.1. ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය වෙනුවෙන් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්,

- ආබාධ සහිත පුද්ගලයින් ඇතුළත් වූ මැතිවරණ ක්‍රියාවලිය සඳහා ඇති නෛතික බාධක සහ නීති ප්‍රතිසංස්කරණ සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

- සියලුම මැතිවරණ සහ ඡන්ද විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඡන්ද පොල වෙත යන ආබාධිත ඡන්ද හිමියන් සම්බන්ධයෙන් විශේෂ පහසුකම් සැපයීමට අදාළ කටයුතු.
- ඡන්දය දීමේ ක්‍රියා පටිපාටි, පහසුකම් හා උපකරණ තේරුම් ගැනීමට හා භාවිත කිරීමට සුදුසු, ලබාගත හැකි හා පහසු බව තහවුරු කිරීම.
- ආබාධ සහිත පුද්ගලයන්ට ඡන්දය දීමට හා තේරී පත්වීමට ඇති අයිතිය, නිදහස් සහ රහස්‍යභාවය ආරක්ෂා වන පරිදි අන් අය හා සමාන පදනමකින් ඵලදායීව හා පූර්ණ වශයෙන් සහභාගීවීම තහවුරු කිරීම.
- ඡන්ද දායකයන් ලෙස ආබාධ සහිත පුද්ගලයින්ගේ කැමැත්ත නිදහසේ ප්‍රකාශ කිරීම සහතික කිරීම හා අවශ්‍ය තැන්හි ඒ සඳහා ඔවුන්ගේ ඉල්ලීම අනුව ඔවුන් විසින් ම තෝරා ගන්නා පුද්ගලයෙකු මාර්ගයෙන් ඡන්දය දීමට ආධාර දීමට ඉඩදීම.

**17.2. ආබාධිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය වෙනුවෙන් 2021 වර්ෂයේ සැප්තැම්බර් මස අවසානය වන විට සිදුකර ඇති වැඩසටහන්**

- ආබාධ සහිත තැනැත්තන්ගේ තාක්ෂණික කමිටුව විසින් 2021 වර්ෂය තුළ සිදුකිරීමට සැළසුම් කර ඇති වාර්ෂික සැළසුම පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාව සමග සාකච්ඡාවක් 2021.03.18 දින මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන ශ්‍රවණාගාර ශාලාවේ දී පවත්වන ලද අතර ආබාධ සහිත තැනැත්තන් ඡන්දය සලකුණු කිරීමේ දී මුහුණපාන ප්‍රායෝගික ගැටලු පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කිරීමේ වැඩ සටහනක් සහ 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් පිළිබඳ සැළසුමක් සකස් කිරීම එමගින් අපේක්ෂා කරන ලදී.

- ආබාධ සහිත වූවන් ඇතුළත් වූ මැතිවරණ ක්‍රියාවලියක් සඳහා වූ තාක්ෂණික කමිටු (DIESL-TWG-) සාකච්ඡාවක් 2021.05.20 දින Zoom තාක්ෂණය ඔස්සේ පවත්වා ඉදිරි මාසවල සිදුකිරීමට නියමිත වැඩසටහන් සැළසුම් කිරීම සිදුකරන ලදී.

- ශ්‍රවණාබාධ සහිත පුද්ගල සංවිධාන නියෝජිතයින් සමඟ සාකච්ඡාවක් 2021.05.23 දින Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලද අතර එහි දී මැතිවරණ ක්‍රියාවලියට අදාළ සංඥා භාෂාව සඳහා නව සංඥා ඇතුළත් පාරිභාෂිත සංඥාවන් සකස් කිරීම සඳහා අනුකමිටුවක් පත්කර ගැනීමත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ඔවුන් සඳහා නිකුත් කරන හැඳුනුම්පත මැතිවරණයේ දී පිළිගත් හැඳුම්පතක් ලෙස පිළිගැනීමට අවශ්‍ය නෛතික වලංගුතාව පිළිබඳ සාකච්ඡා කරන ලදී.


- ආබාධ සහිත වූවන් ඇතුළත් මැතිවරණ ක්‍රියාවලියක් සඳහා වූ තාක්ෂණික කමිටු (DIESL-TWG-) සාමාජිකයින් විසින් දැනට පවත්නා මැතිවරණ නීති සංශෝධනය සඳහා පත්කර ඇති පාර්ලිමේන්තු තේරීම්කාරක සභාව වෙත ඉදිරිපත් කෙරෙන යෝජනාවලිය සකස් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් 2021.05.24 දින Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී.

- ඔස්ට්‍රේලියානු මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ ක්‍රියාවලිය සඳහා වූ ජාත්‍යන්තර පදනම (IFES) ආයතනය සමඟ ඒකාබද්ධ වී අන්තර්කරණය වූ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහනක් Zoom තාක්ෂණය ඔස්සේ 2021.08.02 /03/05 සහ 06 (දින 4ක) පවත්වන ලද අතර එමගින් අන්තර්කරණය පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය කිරීම අපේක්ෂා කරන ලදී.

### 17.3. කාන්තා හා තරුණ කොටස් ඇතුළත් මැතිවරණ ක්‍රියාවලිය

සියළු පාර්ශ්ව ඇතුළත් මැතිවරණ ක්‍රියාවලියක් යටතේ තරුණ හා කාන්තා සංවිධාන සමඟ ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කොට එම කොටස් සක්‍රිය ලෙස මැතිවරණ ක්‍රියාවලියට දායක කර ගැනීම සඳහා 2015 වර්ෂයේ සිට විවිධ වැඩසටහන් ලංකාව පුරා ක්‍රියාත්මක කරන ලදී. කාන්තා හා තරුණ කොටස් මැතිවරණ ක්‍රියාවලිය කෙරෙහි උනන්දු කරවමින් ඒ තුළින් ප්‍රජාතන්ත්‍රවාදය හා ඡන්ද බලය පිළිබඳ දැනුම වර්ධනය කිරීමත් අපේක්ෂා කරන ලද අතර එම වැඩසටහන් බොහෝ පාර්ශවවල ඇගයුමට පාත්‍ර වී තිබුණි.

මෙම වර්ෂය තුළ දී ද මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩසටහන් සකස් කළ ද රට තුළ අනපේක්ෂිත ව ව්‍යාප්ත වූ කෝවිඩ් -19 වෛරසය ව්‍යාප්තිය හේතු කොට ගෙන සංචරණ සීමා පැනවීම හා පුද්ගල ඒකරාශී වීම් තහනම් වූ බැවින් එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.




## 18. මූල්‍ය පාලනය

2021 වර්ෂය වෙනුවෙන් වියදම් දැරීම පිණිස විසර්ජන පනත මඟින් රුපියල් මිලියන 1,017.34 ප්‍රතිපාදන වෙන්කර ඇති අතර එම ප්‍රතිපාදන තුළ පුනරාවර්තන වියදම් දැරීම සඳහා රුපියල් මිලියන 888.34 ද මූලධන වියදම් දැරීම සඳහා රුපියල් මිලියන 129ක් ද ඇතුලත්ය.

පුනරාවර්ථන වියදම් දැරීම සඳහා වෙන් කළ ප්‍රතිපාදන වලින් 2021.09.30 දින දක්වා රුපියල් මිලියන 542.33ක් වියදම් කර ඇත. මූලධන වියදම් දැරීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන වලින් 2021.09.30 දින දක්වා රුපියල් මිලියන 10.75 ක් වියදම් කර ඇත. මූලධන වියදම් ප්‍රතිපාදන උපයෝගි කරගෙන වැඩ ආරම්භ කර තිබූ කාර්යයන් දැනට පවත්නා කොරෝනා වසංගත තත්ත්වය යටතේ නිසි කළට අවසන් කිරීමට නොහැකි වීම මත මෙම ප්‍රතිපාදන ඉතිරිවීමට බලපා ඇත.

2020.08.05 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා වැය වූ සම්පූර්ණ මුදල රුපියල් මිලියන 5,727.9ක් වන අතර 2020 වර්ෂයේ ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 5,700.9ක් ද, 2021 වර්ෂයේ ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 27ක් ද වියදම් දරා ඇත.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය වෙත ණය පහසුකම් ලබාදීම සඳහා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ රුපියල් මිලියන 38ක් විසර්ජන පනත මගින් වෙන්කර ඇති අතර එම වෙන්කළ මුදලින් රුපියල් මිලියන 8.02 ණය අත්තිකාරම් කාර්ය මණ්ඩලයේ 69 දෙනෙකු සඳහා 2021.09.30 දින වනවිට ලබාදී ඇත.

## 19. විගණන තොරතුරු

2021 වර්ෂය වෙනුවෙන් 2021.09.30 දින දක්වා ජාතික විගණන කාර්යාලයේ විගණන අංශය මගින් විගණන විමසුම් 06ක් ඉදිරිපත් කර ඇති අතර එම විගණන විමසුම් 06 කට මේ වන විට පිළිතුරු සපයා ඇත.

මැතිවරණ කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් දැනට පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදය යටතේ අඩුපාඩු හා දුර්වලතා අනාවරණය කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන අංශය විසින් 2021 වර්ෂයේ සැප්තැම්බර් 30 වන දින දක්වා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල 08ක විගණන කටයුතු සිදු කර විගණන වාර්තා 08ක් ඉදිරිපත් කර ඇති අතර විමර්ශන කටයුතු 02ක් සිදු කර වාර්තා 02ක් සපයා ඇත. තවද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02ක් පවත්වා ඊට අදාල වාර්තා ලබා දී ඇත.

එසේම විගණන විමසුම් අවම කර ගැනීම් වස් යහපත් මූල්‍ය පාලනය ස්ථාපිත කර ගැනීම සඳහා කොමිෂන් සභාවේ හා දිස්තික් මැතිවරණ කාර්යාලවල නිලධාරීන් දැනුම්වත් කිරීමට ද අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කොට ඇත.

## 20. මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය

මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන්ට ඔවුන්ගේ සේවා අවශ්‍යතා වෙනුවෙන් හා වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබාගැනීමේ අරමුණින් ධාරිතා වර්ධන පුහුණු වැඩසටහන් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙනු ලබයි. මේ සඳහා මෙම වර්ෂයේ දී රුපියල් මිලියන හතරක පමණ ප්‍රතිපාදන වෙන් ව තිබුණි. රට තුළ පැවැති අයහපත් වාතාවරණය මධ්‍යයේ වුව ද නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා ඒ සඳහා ඔවුන්ව අභිප්‍රේරණය කිරීම, අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම සංවිධානය කිරීම හා වෙනත් ආයතන සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම සිදු කරන ලදී. ඒ අනුව,

- සියලුම මාණ්ඩලික නිලධාරීන් සඳහා 2021.03.28 හා 29 යන දෙදින වාරියපොල පළාත් සභා පුහුණු ආයතනයේ දී ප්‍රසම්පාදන හා මූල්‍ය පාලනය පිළිබඳව පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.
- මිලෝදා ආයතනය, මොරටුව විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන විසින් පවත්වන ලද තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධි පාඨමාලාව, ප්‍රසම්පාදන උසස් ඩිප්ලෝමා

පාඨමාලා, අභ්‍යන්තර විගණන ඩිප්ලෝමා පාඨමාලා සඳහා මාණ්ඩලික නිලධාරීන් සහභාගී කරවීම සිදු කර ඇත.

- මැතිවරණ ක්‍රම සඳහා වූ ජාත්‍යන්තර ආයතනය (IFES) ආයතනය සංවිධානය කරන ලද මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව පුහුණු වැඩමුළුවක් මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන් ඒකාබද්ධ කොට පවත්වන ලදී.
- රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් හා ලේඛන සහකාර නිලධාරීන් ආයතන හා පාල පරිගණක මෘදුකාංග භාවිතාව, තොරතුරු තාක්ෂණ භාවිතාව පිළිබඳව වූ බාහිර ආයතනවල පවත්වන පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවන ලදී.
- (IFES) ආයතනයේ සහයෝගය ලබා ගනිමින් අන්තර්ජාතික පුහුණුකරුවන් දෙදෙනෙකුගේ සහභාගිත්වයෙන් Zoom තාක්ෂණය ඔස්සේ සයිබර් ආරක්ෂණය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ සටහනක් 2021 අගෝස්තු 2, 3 හා 4 යන දිනවල දී පවත්වන ලදී.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරින් සඳහා විවෘත මෘදුකාංග භාවිතය පිළිබඳ න්‍යායාත්මක පුහුණුවක් Zoom තාක්ෂණය ඔස්සේ සිදු කිරීම 2021 ජූලි සිට සැප්තැම්බර් මාසවල දී පවත්වන ලද අතර එමගින් නිලධාරීන්ගේ තොරතුරු තාක්ෂණය පිළිබඳ ධාරිතා සංවර්ධනය කිරීමට කටයුතු කළ අතර මැතිවරණ කොමිෂන් සභාව මගින් ජනතාව වෙත ලබාදෙනු ලබන ඉ - සේවාවන් පුළුල් කිරීමට එම පුහුණුව මගින් අපේක්ෂා කරන ලදී.



- මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ මානසික අභිප්‍රේරණය හා සුභාවිත ගීත රසවින්දනාත්මක වැඩසටහනක් 2021.03.23 වන දින ප්‍රධාන කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. මෙම වැඩසටහන මෙහෙයවන ලද්දේ ජාතික අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විශාරද සුදත් සමරසිංහ මහතා විසිනි.



## 21. විදේශ පුහුණු වැඩසටහන්

සමාලෝචිත කාලයට අදාළව මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා මාර්ගගතව පවත්වන ලද විදේශ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු මතු දක්වා ඇත.

| පුහුණුව | කාලසීමාව | සහභාගී වූ නිලධරයන් කාණ්ඩය/ කාණ්ඩ |
|---|---|---|
| ඡන්ද හිමියන් ලියාපදිංචිය පිළිබඳ ධාරිතා වැඩසටහන | 202103.15 සිට 19 දක්වා | මාණ්ඩලික නිලධාරීන් |
| Cyber Hygiene Awareness Course | 2021.06.09, 10 හා 11 | මාණ්ඩලික නිලධාරීන් හා තොරතුරු තාක්ෂණ නිලධාරීන් |
| Cyber Hygiene Awareness (TOT) | 2021.06.25 සිට 28 දක්වා | තොරතුරු තාක්ෂණ නිලධාරීන් |
| Cyber Hygiene Training for lead facilitators | 2021-08-02, 03 හා 04 | මාණ්ඩලික නිලධාරීන් හා තොරතුරු තාක්ෂණ නිලධාරීන් |

## 22. විදේශ නිල චාරිකා

කොවිඩ් 19 ව්‍යාප්තිය කාලසීමාවට අදාළ සංචරණ සීමා හේතුවෙන්, 2021.09.30 දින දක්වා කිසිදු විදේශීය නිල චාරිකාවක් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් හෝ නිලධරයන් සහභාගී වී නොමැත.

## 23. දේශපාලන පක්ෂ ලේකම්වරු සමග පවත්වන ලද සාකච්ඡා

මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම කාලය තුළ දී පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්/ නිත්‍ය නියෝජිතවරුන් සමග 2021.01.11 දින සාකච්ඡාවක් පවත්වා තිබේ. මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධානත ම පාර්ශ්වකාර කණ්ඩායමක් වූ පිළිගත් දේශපාලන පක්ෂවල ලේකම්වරු හා නිත්‍ය නියෝජිතයන් සමග පැවති මෙම සාකච්ඡාවේ දී ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලියේ දී දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීත්වය, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා දේශපාලන පක්ෂවල නිලධාරීන් හා ක්‍රියාකාරීන්ගේ සහාය ලබා ගැනීම, මාධ්‍ය උපමාන හා ආචාරධර්ම පිබඳව, දේශපාලන පක්ෂ ලියාපදිංචිය හා වාර්ෂික වාර්තා ලබා දීම, පළාත් පාලන ආයතන පුරප්පාඩු පිරවීම, උපාය මාර්ග සැලැස්ම සඳහා යෝජනා ලබා ගැනීම, පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වීම සම්බන්ධව හා මැතිවරණ නීති සංශෝධනය පිණිස පත් කරන ලද පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව වෙත මැතිවරණ කොමිෂන් සභාව ඉදිරිපත් කළ යෝජනා සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.



## 24. දිස්ත්‍රික් ලේකම්වරු/ දිසාපතිවරු සමඟ පවත්වන ලද සාකච්ඡා

එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයන් හි දිස්ත්‍රික් ලේකම්වරු, ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ලියාපදිංචි කිරීමේ නිලධාරීන් ලෙස පත් කරනු ලබන අතර ඡන්ද විමසීම් වලදී තේරීම්භාර නිළධාරීන් වශයෙන් පත් කරනු ලැබේ. මැතිවරණ කොමිෂන් සභාවේ සමීපතම බාහිර නිළධාරීන් වන දිස්ත්‍රික් ලේකම්වරු සමඟ රැස්වීමක් 2021.04.07 දින මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී පවත්වන ලදී.

එම රැස්වීම මැතිවරණ කොමිෂන් සභාවේ ඉදිරි කටයුතු වලදී දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අදහස් ලබා ගැනීම සඳහා ඉතා ප්‍රයෝජනයක් විය. මෙම රැස්වීමට පූර්වගාමීව ඡන්ද හිමියන් ගණන් ගැනීමේ කටයුතු වල යෙදෙන ග්‍රාම නිලධාරීවරුන්ගේ නියෝජිතයන් සමඟ 2021.04.06 දින රැස්වීමක් පවත්වන ලදී. එහෙදී ඡන්ද හිමියන් ලියාපදිංචිය පිළිබඳ ඔවුන්ට ඇති ගැටලු පිළිබඳව සාකච්ඡා කර සුදුසු තීරණ වලට එළඹෙන ලදී.




## 25. මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සමඟ පවත්වන ලද සාකච්ඡා

මැතිවරණ කොමිෂන් සභාව විසින් දේශීය මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සමඟ සෘජුව ම කටයුතු කරනු ලබයි. මෙම වර්ෂයේ දී එම සංවිධානවල නියෝජිතයන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වා ඇත. මෙම සාකච්ඡාවල දී නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල කාර්යභාරය පිළිබඳවත් මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ග සැලැස්ම සකස් කිරීම සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම පිළිබඳවත් හා මැතිවරණ නීති සංශෝධනය පිණිස පත් කරන ලද පාර්ලිමේන්තු තේරීම්කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද යෝජනා පිළිබඳවත් සාකච්ඡා කරන ලදී.



## 26. දකුණු ආසියානු මැතිවරණ කළමනාකරණ ආයතන බලධාරීන්ගේ සංසදය (FEMBoSA) 2021 සමුළුව

දකුණු ආසියානු කලාපීය රටවල මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව ඇත්දැකීම් හා දැනුම හුවමාරු කර ගැනීමේ අරමුණ ඇතිව වර්ෂ 2010 දී බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය හා පාකිස්ථානය දකුණු ආසියානු රටවල මැතිවරණ කළමනාකරණ ආයතනවල නියෝජිතයන් බංගලදේශයේ ඩකා නුවර දී රැස් වී මෙම සංසදය පිහිටුවා ගන්නා ලදී. එයට අනුෂංගිකව වාර්ෂික මහසභා රැස්වීම ද පවත්වා සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන ප්‍රඥප්තියක් ද සකස් කර එළිදැක්වී ය.

මේ වන විට ශ්‍රී ලංකාව ඇතුළුව ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය හා පකිස්ථානය යන රටවල් මෙම සංසදයේ නිත්‍ය සාමාජිකයන් වේ.

අරම්භක රැස්වීමෙන් පසුව 2011 වර්ෂයේ දී පාකිස්ථානය, 2012 වර්ෂයේ දී භූතානය, 2014 වර්ෂයේ දී නේපාලය, 2015 වර්ෂයේ දී ශ්‍රී ලංකාව, 2016 වර්ෂයේ දී මාලදිවයින, 2017 වර්ෂයේ දී ඇෆ්ගනිස්ථානය හා 2018 වර්ෂයේ දී බංග්ලාදේශය යන සාමාජික රටවල දී වාර්ෂික සමුළු පැවැත් වූ අතර, 10 වන වාර්ෂික සමුළුව 2020 වර්ෂයේ ජනවාරි මස 24 දින ඉන්දියාවේ නව දිල්ලි නගරයේ දී පවත්වන ලදී.

2021 වාර්ෂික සමුළුව භූතානයේ දී පැවැත්වීමට නියමිතව තිබු අතර, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් එම සමුළුව ZOOM තාක්ෂණය ඔස්සේ 2021.08.11 දින පවත්වන ලදී. මෙවර සමුළුවේ තේමාව වූයේ "මැතිවරණයේ දී තාක්ෂණය භාවිතා කිරීම" යන්නයි. ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් මෙම සමුළුව සඳහා සාමාජික ජීවන් ත්‍යාගරාජා මහතා, මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා, මැතිවරණ කොමිෂන් සභාවේ ලේකම් එච්.එම්.ටී.ඩී.හේරත් මහතා, අතිරේක මැතිවරණ කොමසාරිස් නාලක කළුවැව මහතා,නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් එස්.අච්චුදන් මහතා, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් සමන්ත ජයසිංහ මහතා සහභාගී වූහ.



## 27. මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු

### 27.1. 2021 වර්ෂයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡා පිළිබඳ තොරතුරු

- මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය/ කර්තව්‍ය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන විධායක නිලධාරීන්, ප්‍රතිපත්ති කර්තෘවරු, ප්‍රවෘත්ති සංස්කාරකවරු සහ මාධ්‍යවේදීන් කැඳවා 2021.01.12 හා 2021.01.19 දිනවල දී මාධ්‍ය සාකච්ඡා දෙකක් පවත්වා තිබේ.

- විද්‍යුත් විකාශකයන්ගේ හා කර්තෘ සංසදයේ නිලධාරීන් සමග ද මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය/ කර්තව්‍ය හා ඒ සඳහා පුළුල් ජනතා ප්‍රචාරයක් ලබා ගැනීම පිණිස 2021.01.19 දින සාකච්ඡාවක් පවත්වන ලදී.

- ඡන්දහිමි කාල සීමාව තුළ දී මැතිවරණ කොමිෂන් සභාව නිකුත් කරනු ලබන මාධ්‍ය උපමාන ක්‍රියාත්මක කිරීම හා එමගින් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවැසි පරිසරය නිර්මාණය කර ගැනිම පිණිස ජනමාධ්‍ය අමාත්‍යාංශයේ, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ හා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් සමඟ 2021.02.17 සාකච්ඡාවක් පවත්වන ලදී.

- එසේම මෙයට අමතරව රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් නාලිකාවල සජීවී හා පටිගත කරන ලද වැඩසටහන් සඳහා සභාපති, මැතිවරණ කොමසාරිස් ජනරාල් ඇතුළු නිලධාරීන් අවස්ථා 10කදී පමණ සහභාගී වී කොමිෂන් සභාවේ කාර්යයන් පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීම සිදු කොට ඇත. මුද්‍රිත මාධ්‍ය මගින් ඒ සඳහා අනගි සහායක් ලැබී තිබුණි.



### 27.2. 2021 වර්ෂය තුළ නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන

මැතිවරණ කොමිෂන් සභාව විසින් මතු දැක්වෙන ප්‍රධාන කරුණු අරබයා මාධ්‍ය නිවේදන විසිහයක් (26)ක් පමණ සමාලෝචිත කාලය තුළ නිකුත් කරන ලදී.

- මැතිවරණ කොමිෂන් සභාවේ තීරණ දැනුම් දීම.
- ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය පිළිබඳව හා ඡන්දහිමි නාම ලේඛනයේ මාර්ගගතව ලියාපදිංචි වීමට පහසුකම් සැලසීම.

- ඡන්දහිමි නාමලේඛන තොරතුරු ප්‍රකාශය පරිගණක හා ජංගම දුරකථන ආශ්‍රයෙන් මුද්‍රණය කර ගැනීමේ නව ක්‍රමවේදය පිළිබඳව දැනුම්වත් කිරීම.
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීම පිණිස පත් කරන ලද කමිටුව වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ යෝජනාවලිය
- මියන්මාරයේ පාලනය හමුදාව විසින් අත්කර ගැනීම, ඡන්දයෙන් තේරී පත් වූ නියෝජිතයන් හා මැතිවරණ කොමිෂමේ නිලධාරීන් අත්අඩංගුවට ගැනීමේ ප්‍රජාතන්ත්‍රවාදී විරෝධී ක්‍රියා පිළිවෙතට ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාවේ විරෝධතාව පළ කිරීම.
- පළාත් පාලන ආයතනවල ජනතා නියෝජිතයන්ගේ හැසිරීම/ ක්‍රියා කලාපය තුළින් මෙරට ක්‍රියාත්මක වන නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය, මහජන ඡන්දයෙන් තෝරාපත් කරනු ලබන ජනතා නියෝජිතයන් පිළිබඳව හා එකී ආයතනවල ක්‍රියාකාරීත්වය පිළිබඳව ජනතා විශ්වාසය බිඳ වැටී තිබීම පිළිබඳව සුදුසු පියවර ගන්නා ලෙස ඉල්ලා දේශපාලන පක්ෂ ලේකම්වරු හා ගරු ආණ්ඩුකාරවරුන් දැනුම්වත් කිරීම.
- මැතිවරණ කොමිෂන් සභාව, පාර්ශ්වකාර කණ්ඩායම් හා තරුණ කණ්ඩායම් දීර්ඝ කලක සිට අපේක්ෂා කළ වයස අවුරුදු 18 සම්පූර්ණ වූ වහාම ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී රටේ පාලනයට හවුල් වීමට අවස්ථාව ලැබෙන පරිදි සම්මත වූ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ සංශෝධිත පනත පිළිබඳව.

## 28. මාධ්‍යවේදීන් සඳහා පවත්වන ලද පුහුණු වැඩමුළුව

මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යය, කර්තව්‍ය, මැතිවරණ චක්‍රය, නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා මාධ්‍ය උපමාන භාවිතා කිරීම, මැතිවරණ වාර්තාකරණය, විද්‍යුත් මාධ්‍ය තුළ මැතිවරණ වාර්තාකරණයේ දී මතුවන අභියෝග, ඡන්ද විමසීමක දී මාධ්‍යවේදීන් සතු කාර්යභාරය හා නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා ජනමාධ්‍යවල බලපෑම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ කටයුතු ආවරණය කරනු ලබන විද්‍යුත් හා මුද්‍රිත ආයතනවල මාධ්‍යවේදීන් සඳහා පුහුණු වැඩමුළුවක් 2021.03.16 දින මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ දී පවත්වන ලදී.



මෙම වැඩමුළුව මැතිවරණ කොමිෂන් සභාවේ, සභාපති නීතිඥ නිමල් පුංචිහේවා මහතා හා මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර වැඩමුළුවේ සම්පත්දායකයින් ලෙස ශ්‍රීපාලි මණ්ඩපයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මහාචාර්ය ටියුඩර් වීරසිංහ මහතා , සිරස මාධ්‍ය ජාලයේ අසෝක ඩයස් මහතා, ඉරිදා ලංකාදීප පුවත්පතේ ප්‍රධාන කර්තෘ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී ආරියනන්ද දොඹගහවත්ත මහතා කටයුතු කරන ලද අතර එම වැඩමුළුව ඉතා සාර්ථක හා ඵලදායී අයුරින් සංවිධානය කර තිබූ බව ඒ පිළිබඳව සිදු කළ ඇගයීම අනුව සනාථ විය.

මෙම වැඩමුළුවෙන් අනතුරුව කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත දැනුම්වත් කිරීම්, මාධ්‍ය නිවේදන හා ප්‍රවෘත්ති සඳහා කඩිනම් ප්‍රචාරයක් දෙනු වස් වැඩමුළුව සඳහා සහභාගි වූ ආයතනවල මාධ්‍යවේදීන් ඇතුළත් මාධ්‍ය සාමූහිකයක් (Whatsapp Group) සකස් කළ අතර වර්තමානයේ දී කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධව පුළුල් ප්‍රචාරයක් ලබා ගැනීම වෙනුවෙන් එය මහෝපකාරී වී තිබේ.

## 29. ගොඩනැගිලි ඉදිකිරීම් හා නවීකරණ කටයුතු

### 29.1. යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය ඉදිකිරීම

යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අදාළ ව 2021.09.30 දිනට භෞතික ප්‍රගතිය 66%ක් විය. එම ගොඩනැගිල්ල අදියර දෙකක දී නිම කිරීමට නියමිත අතර 2022 වර්ෂයේ දී දෙවැනි අදියර ආරම්භ කොට අවසන් කිරීමට නියමිතය.

සම්පූර්ණ ඇස්තමේන්තු මුදල - රු.197,000,000.00

2021.11.08 දිනට වැයකර ඇති මුදල - රු.41,185,000.00



### 29.2. සංචාරක නිවාඩු නිකේතනය නවීකරණය කිරීම

පැරණි ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සහකාර කොමසාරිස් නිළ නිවස (එඩින්බරෝ ටෙරස් නිල නිවස) සංචාරක නිවාඩු නිකේතනයක් ලෙස භාවිතා කළ හැකි පරිදි රු.1,739,905.00 වැය කර නාවීකරණය කොට විවෘත කිරීමට කටයුතු සම්පාදනය කොට තිබේ.



## 30. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අදාළ කටයුතු

පළමු කාර්තුවේ දී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අදාළව මැතිවරණ කොමිෂන් සභාවෙන් විමසීම් කරන ලද තොරතුරු ඉල්ලීම් 21කින් 19 ක් සඳහා තොරතුරු ලබා දී ඇති අතර, තොරතුරු ඉල්ලීම් 02 ක් ප්‍රතික්ෂේප කර ඇත. දෙවන කාර්තුවේ දී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අදාළව විමසීම් කරන ලද තොරතුරු ඉල්ලීම් 10 සඳහාම තොරතුරු ලබා දී ඇත. තෙවන කාර්තුවේ දී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අදාළව විමසීම් කරන ලද තොරතුරු ඉල්ලීම් 11 සඳහාම තොරතුරු ලබා දී ඇත.

## 31. දැනුම් කළමණාකරණ ඒකකය හා කෞතුකාගාරය

මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යයන් හා තොරතුරු ලබා ගැනීම පිළිබඳව විද්‍යාර්ථීන්, පර්යේෂකයන්, දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන් හා මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නියෝජිතයන් විසින් නිරන්තරයෙන් විමසීම් කරනු ලබන අතර බොහෝ අවස්ථාවල දී ආයතනය වෙත පැමිණ තොරතුරු ලබා ගැනීම ද සිදු කරනු ලබයි. එබැවින් මෙම කාර්යයන් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් දැනුම් කළමණාකරන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු සම්පාදනය කරන ලදී. මෙහි මූලික පියවර වශයෙන් මේ දක්වා පැවති ලේඛනාගාරය නව පරිශ්‍රයක ස්ථාපිත කොට එය දැනුම් කළමණාකරන ඒකකය වශයෙන් සංවර්ධනය කොට වඩාත් සංවිධිත අයුරින් පවත්වාගෙන යාමට ක්‍රියාකර ඇත. එහි ඇති ලිපි ලේඛන වඩාත් සුරක්ෂිත කර ගැනීම හා ඒවා අවශ්‍යතාව පරිදි ඕනෑම පාර්ශ්වයකට පහසු පරිශීලනය කිරීම සඳහා නිසි පරිදි ගබඩා කර තබා ගැනීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදී. ඉදිරියේ දී මෙම කාර්යය වඩාත් පුළුල් කොට ඉ-තොරතුරු ලබා ගැනීම දක්වා වූ පහසුකම් සලසා දීම කොමිෂන් සභාවේ අපේක්ෂාවයි.

මෙම කාර්යය සඳහා පූර්ණ කාලීනව නිලධාරියකු අනුයුක්ත කර ඇති අතර එම කටයුතු පිළිබඳව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් විධිමත් හුණුවක් ඔහු වෙත ලබා දී ඇත.

මැතිවරණ දෙපාර්තමේන්තුවේ අවුරුදු 60ක ඉතිහාසය සිහි ගැන්වීම පිණිස එම කාලසීමාවේ දී භාවිතා වූ පැරණි ලිපි ලේඛන, අණ පනත්, වාර්තා හා භාණ්ඩ ඇතුළත් කෞතුකාගාරයක් පවත්වාගෙන යාමේ කටයුතු ආරම්භ කොට ඇත.



## 32. කතිරයේ බලය පුවත් සඟරාව

මැතිවරණ කොමිෂන් සභාවේ 2017-2020 දක්වා වූ සිවු  අවුරුදු සහභාගීත්ව උපාය මාර්ගික සැලැස්මේ හඳුනාගන්නා ලද අවධාරිත ක්ෂේත්‍ර යටතේ කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යන් අළලා කාර්තුමය වශයෙන් කතිරයේ බලය නමින් (News Letter) පුවත් සඟරාවක් එළි දක්වන ලදී. එහි කතිරයේ බලය පුවත් සඟරාවේ හතරවන වෙළුමේ තුන්වන කලාපය (සැප්තැම්බර් - දෙසැම්බර් 2020) සහ පස්වන වෙළුමේ පළමු කලාපය (ජනවාරි - අප්‍රේල් 2021)  එක් කලාපයක් ලෙසින්  මුද්‍රණය කිරීම. පස්වන වෙළුමේ දෙවන කලාපය (මැයි - අගෝස්තු 2021)  එක් කලාපයක් ලෙසින්  මුද්‍රණය කිරීම සිදු කොට ඇත. එසේම මෙම වර්ෂයේ අවසන් කලාපය සකස් කිරීමේ කටයුතු මෙ වන විට ආරම්භ කොට ඇත.





## 33. මැතිවරණ වාර්තා


කිසියම් නිතියක් මඟින් නියම කොට නොතිබුණ ද මැතිවරණයක් පැවැත්වීමෙන් අනතුරුව එම මැතිවරණය සම්බන්ධ වාර්තාවක් නිකුත් කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව මෙන්ම මැතිවරණ කොමිෂන් සභාව ද සම්ප්‍රදායානුකූලව කටයුතු කර ඇත. එසේම ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම සඳහා වූ ඡන්ද විමසීම හා පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද සියළුම ගැසට් නිවේදන ඒකාබද්ධ කොට පොත් දෙකක් වශයෙන් මුද්‍රණය කිරීමටද කටයුතු සම්පාදනය කොට තිබේ.


මැතිවරණයක් පැවැත්වීමෙන් පසු නිකුත් කරනු ලබන වාර්තාව, ඊට අදාළ මැතිවරණ නීති සඳහා අවශ්‍ය සංශෝධන, දේශපාලන පක්ෂ, මන්ත්‍රී සංඛ්‍යාව, ඡන්ද හිමි නාමලේඛන සකස් කිරීම, ඡන්ද කොට්ඨාස, ඡන්ද පොළවල්, නාමලේඛන භාරගැනීම, ඇප තැන්පත් කිරීම, නිලධාරීන්  පත් කිරීම හා පුහුණු කිරීම, තැපෑලෙන් ඡන්දය දීම, ප්‍රවාහන කටයුතු ඇතුළු මූලික සංවිධාන ක්‍රියාවලිය, ඡන්ද විමසීම පැවැත්වීම, ගණන් කිරීම, ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම, ප්‍රචාරක කටයුතු, ආරක්ෂක වැඩපිළිවෙල හා පැමිණිලි කළමනාකරණය සහ සම්පූර්ණ ප්‍රතිඵල ආදී මැතිවරණයට අදාළ සියලු කරුණු කාරණාවලින් සංගෘහිත වේ. එබැවින් මැතිවරණයට අදාළව ඊට අනුශංගික  සියලුම කරුණු කාරණා සාරාංශ කොට වාර්තා කිරීම තුළින් එම මැතිවරණය පිළිබඳව අධ්‍යයනය කරන්නන්ට, පර්යේෂකයන්ට, තොරතුරු ගවේෂකයන්ට, ඉදිරි මැතිවරණ මෙහෙයුම් ක්‍රියාවලියට, දේශපාලන පක්ෂවල ඉදිරි සැලසුම්වලට මනා පිටුවහලක් වනු ඇත. ඒ අනුව පාර්ලිමේන්තු මැතිවරණ හෝ

වෙනත් ඡන්ද විමසීමක් පිළිබඳ අදාළ සියලුම තොරතුරුවලින් සමන්විත වූ වාර්තාවක් නිකුත් කිරීම හා ඒ පිළිබඳ උනන්දුවක් දක්වන සියලු පාර්ශ්වවල ශාස්ත්‍රීය අවශ්‍යතා සම්පූර්ණ වීමක් ද වේ.

ඒ අනුව 2019.11.16 දින පැවති පවත්වන ලද ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ ඡන්ද විමසීම හා 2020.08.05 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේ වාර්තා එළි දැක්වීමට සියළු කටයුතු මේ වන විට සූදානම් කොට ඇත.


එසේම ජනාධිපතිවරයා තෝරාපත් කැගැනීම සඳහා වූ ඡන්ද විමසීම පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද සියළුම ගැසට් නිවේදන ඒකාබද්ධ කරමින් පොත් දෙකක් වශයෙන් මුද්‍රණය කිරීමට කටයුතු සම්පාදනය කොට තිබේ.




## 34. තොරතුරු තාක්ෂණ භාවිත කිරීමේ මාර්ගෝපදේශ සංග්‍රහය

මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය ඇතුළු සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ භාවිතා වන පරිගණක, පරිගණක උපාංග, මෘදුකාංග සහ තොරතුරු පද්ධති, ජාලකරණ උපකරණ සහ පරිගණක ජාලවල ක්‍රියාකාරීත්වය කෙසේ සිදු කළ යුතු ද යන්න සහ එම උපකරණ හා පද්ධතිවලට සිදුවිය හැකි බලපෑම් සහ හානි පිළිබඳව හා ඒවා වළක්වා ගැනීම පිළිබඳව විස්තර කෙරෙන මාර්ගෝපදේශ සංග්‍රහය මෙම වාර අවසානයට පෙර එළි දැක්වීමට තොරතුරු තාක්ෂණ අංශය විසින් කටයුතු සංවිධානය කොට ඇත.



## 35. සමාප්තිය

2022 අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරනු ලබන මැතිවරණ කොමිෂන් සභාවේ මෙම වාර්තාව 2021.01.01 දින සිට 2021.09.30 දක්වා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්/ ව්‍යාපෘතිවලට අදාළ තොරතුරුවලින් සංගෘහිත වේ. මෙම කාලය තුළ දී කොවිඩ් වසංගතය පාලනය පිණිස සංචරණ සීමා කිරීම්, රාජ්‍ය ආයතන වසා තැබීම් ආදී පරිපාලනමය බාධා මධ්‍යයේ වුව ද අපේක්ෂිත ඉලක්ක සපුරාලිය හැකි මට්ටමේ කාර්ය සාධනයක් අත්පත් කර ගැනීමට හැකි වී ඇති බැව් මෙම වාර්තාවේ ඇතුළත් කරුණු අනුව ස්ඵුට වේ. සමාලෝචිත කාලය තුළ දී මැතිවරණ කොමිෂන් සභාව විසින් පොදු මහජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන සේවාවන් මහජන හිතකාමී අයුරින් වඩාත් පහසු ආකාරයට ඉටු කිරීම හා ඒ සඳහා වූ නවෝත්පාදන ක්‍රියාවලීන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලද බව නිරීක්ෂණය වන අතර ඉදිරි මාස තුනක කාලය තුළ දී අත්හැරුණු ඉලක්ක සපුරා ගැනීමට අවැසි සියළු පූර්වෝපායන් යොදා ඇති බව ද ප්‍රකාශ කළ යුතු ව ඇත.